PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව
2024

			අන්තර්ගතය	පිටුව
	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දැක්ම හා මෙහෙවර			02
	අරමුණු හා පරමාර්ථ			03
	අධ්‍යක්ෂකවරයාගේ පණිවුඩය			06
1.	සංවිධාන සැලැස්ම			08
	(a)	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයින්		
		i)	කළමනාකරණ මණ්ඩලය	09
		ii)	දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය	11
		iii)	දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය	12
		iv)	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින්	13
		v)	සේවක වර්ගීකරණය	15
2.	අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය අභියෝග අනාගත සැලසුම්			16
	(අ)	කෙටි හැඳින්වීම		16
	(ආ)	වැදගත් සිදුවීම්හි සාරාංශය		19
	(ඇ)	මූල්‍ය කාර්‍යසාධනය		23
	(ඈ)	අභියෝග		25
	(ඉ)	අනාගත සැලසුම්		26
	(ඊ)	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් පවත්වනු ලබන වැඩසටහන් සහ සිසුන් පිළිබඳ විස්තර		26
	(උ)	සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර		29
	(ඌ)	මානව සම්පත්		30
3.	කාර්‍ය මණ්ඩලය විසින් සිදුකරන ලද පර්‍යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර			31
4.	අනාගත තිරසර සංවර්ධන අපේක්ෂාවන්			33
5.	විගණන කමිටු වාර්තාව			35
6.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ			36
7.	විගණකාධිපති වාර්තාව			68
8.	විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු			75

දැක්ම

ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කිරීමේ සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණවල නායකත්වය ඉසිලීම හා දේශීය සහ ගෝලීය අවශ්‍යතා සහ ප්‍රවණතාවලට නිර්මාණාත්මක සහ පසුබිමක් සහිතව පිළිතුරු සපයන ප්‍රමුඛතා වෙනුවෙන් ප්‍රචලිත වීම.

මෙහෙවර

ස්වයං යොමුවක් සහ ස්වයං නිදහස් ඉගෙනීම තුලින් ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනයෙහි පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යයනය, පර්යේෂණ, ගුරු අධ්‍යාපනය, නව සොයාගැනීම් සහ ඉගෙනීමෙහි විශිෂ්ඨතාව සඳහා අවස්ථාව ලබා දීම සහ ජාතික මට්ටමින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අධ්‍යාපනය ඉදිරියට ගෙන යාම සහ ඊට නායකත්වය සැපයීම.

අරමුණ 1 : ඉංග්‍රීසි භාෂා අධ්‍යනය සහ අධ්‍යාපනය පිළිබඳ ඉහල ගුණාත්මක භාවයෙන් යුතු පශ්චාත් උපාධි වැඩසටහන්/පාඨමාලා ලබා දීම

පරමාර්ථ

1.1 පවතින අධ්‍යයන වැඩසටහන් සහ පාඨමාලා සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.

1.2 ජාතික අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන නව සහ නව්‍ය වැඩසටහන්/පාඨමාලා සංවර්ධනය කිරීම සහ පිරිනැමීම.

උපායමාර්ග

1.1 පවතින අධ්‍යයන වැඩසටහන් සහ පාඨමාලා සැපයීමේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.

1.1.1 පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සහ උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය සඳහා වන ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශන (**SLQF**) අත්පොතට අදාළව පවතින අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය කර අඩු පාඩු හඳුනා ගැනීම.

1.1.2 සමකාලීන අවශ්‍යතා සපුරාලීම සඳහා දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීමේ ශාස්ත්‍රපති වැඩසටහන සංශෝධනය කර ප්‍රතිව්‍යුහගත කිරීම.

1.1.3 පවතින පාඨමාලා ඉගැන්වුම් ක්‍රම සමාලෝචනය කර ඒවා සංශෝධනය කිරීම හෝ නව ඉගැන්වුම් ක්‍රම සැලසුම් කිරීම **(PPE, BE-2025, TESL – 2026/7)**

1.2 ජාතික අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන නව සහ නව්‍ය වැඩසටහන්/පාඨමාලා සංවර්ධනය කිරීම සහ පිරිනැමීම.

1.2.1 අදාළ අධ්‍යයන ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර වශයෙන් නව වැඩසටහන්/පාඨමාලා සංවර්ධනය කිරීම

1.3 ඉල්ලුමට අනුව පවතින කෙටිකාලීන පාඨමාලා ප්‍රදානය කිරීම

1.3.1 ඉල්ලුමට අනුව පවතින කෙටිකාලීන පාඨමාලා ප්‍රදානය කිරීම

අරමුණ 2: වඩාත් කාර්යක්ෂම සහ අධීක්ෂණයෙන් යුතු සේවාවක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබා දීම පිණිස පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම

පරමාර්ථ

2.1 පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

2.2 ආයතනයේ මානව සම්පත් ධාරිතාව (අධ්‍යන සහ පරිපාලන) ශක්තිමත් කිරීම

2.3 දත්ත ආරක්ෂා කිරීම සහ දත්තවල ආරක්ෂිත පිටපත් පවත්වා ගැනීම සඳහා පද්ධති සංවර්ධනය කිරීම

2.4 හරිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

2.5 පවත්නා භෞතික යටිතල පහසුකම් අවශ්‍යතා ඇගයීම

උපායමාර්ග

2.1 පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

2.1.1 පරිපාලන ක්‍රියාවලි අධීක්ෂණය කිරීම සඳහා පවතින පරිපාලන ක්‍රියාවලිවල අඩුපාඩු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම

2.1.2 ශිෂ්‍ය තොරතුරු කළමනාකරණය සහ ගිණුම්කරණ/මූල්‍ය කළමනාකරණ පද්ධතිය පරිපාලනය කිරීම සඳහා මෘදුකාංග පදනම් කරගත් විසඳුමක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

2.2 **ආයතනයේ මානව සම්පත් ධාරිතාව (අධ්‍යන සහ පරිපාලන) ශක්තිමත් කිරීම**

2.2.1 ශාස්ත්‍රීය සහ පරිපාලන මානව සම්පත් අවශ්‍යතා සමාලෝචනය කර ඉටු කිරීම

2.2.2 පරිපාලන සහ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ ධාරිතාව සහ නිපුණතා වර්ධනය කිරීම

2.3 **නිසි දත්ත ප්‍රවේශය සහ ආරක්ෂාව සඳහා පද්ධති සංවර්ධනය කිරීම**

2.3.1 පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දත්තවල ප්‍රවේශ අයිතිවාසිකම් සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පද්ධති ක්‍රියාත්මක කිරීම

2.4 **හරිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම**

2.4.1 භාවිතා කරන කඩදාසි සහ පොලිතීන් ප්‍රමාණය අඩු කිරීම

2.4.2 නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති භාවිතා කිරීම.

2.5 **පවතින භෞතික යටිතල පහසුකම් අවශ්‍යතා ඇගයීම**

2.5.1 **පවතින යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීමට පියවර ගැනීම**

2.5.2 **එම අවශ්‍යතා සපුරාලීමට පියවර ගැනීම**

අරමුණ 3 : **ආයතනයේ පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ධාරිතාව වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම**

පරමාර්ථ

3.1 නවෝත්පාදන පර්යේෂණවල නියැලීම, නිපදවීම සහ ප්‍රචාරණය සඳහා අධ්‍යන කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා වන අවස්ථාවන් ඉහළ නැංවීම.

3.2 අධ්‍යන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහතික කිරීම

3.3 ශිෂ්‍ය පර්යේෂණ ප්‍රචාරණය සඳහා අවස්ථාවන් සලසා දීම

3.4 ජාතික ප්‍රමුඛතාවන් සඳහා පිළියම් ලබාදීමට උපකාරීවන ආයතනික පර්යේෂණ සිදු කිරීම සහ සංවර්ධනය කිරීම

3.5 ක්ෂේත්‍රය තුළ පර්යේෂණ ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය

උපායමාර්ග

3.1 **අධ්‍යයන හා අදාළ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නව්‍ය පර්යේෂණවල නියැලීමට සහ ව්‍යාප්ත කිරීමට ඇති අවස්ථා වැඩි දියුණු කිරීම.**

3.1.1 අධ්‍යයන කාර්ය මණ්ඩලයට දේශීය හා විදේශීය හවුල්කරුවන් සමඟ සහයෝගී පර්යේෂණවල නියැලීමට ඇති අවස්ථා වැඩි කිරීම.

3.1.2 පිළිගත් ප්‍රකාශකයන් මගින් පර්යේෂණ ප්‍රකාශනය ප්‍රවර්ධනය කිරීම.

3.2 **අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහතික කිරීම**

3.2.1 අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම

3.3 **ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාප්ත කිරීම සඳහා අවස්ථාවන් සලසා දීම**

3.3.1 ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාප්ත කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම

3.3.2 ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී පර්යේෂණ ඉදිරිපත් කිරීමට සිසුන් දිරිමත් කිරීම සහ සහාය දීම

3.4 **ජාතික ප්‍රමුඛතාවලට පිළියම් යෙදීමට උපකාරී වන ආයතනික පර්යේෂණ සංවර්ධනය කිරීම සහ පැවැත්වීම**

3.4.1 ආයතනික පර්යේෂණ සඳහා අරමුදල් සපයා ගැනීමේදී ක්‍රියාකාරීව නිරත වීම
3.4.2 ආයතනික පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ පැවැත්වීම
3.4.3 ආයතනික පර්යේෂණ ව්‍යාප්ත කිරීම

3.5 ක්ෂේත්‍රය තුළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම

3.5.1 පර්යේෂකයන්ට සිය කෘති ප්‍රකාශයට පත් කිරීමට අවස්ථා නිර්මාණය කිරීම
3.5.2 ක්ෂේත්‍රයේ පෙර පර්යේෂණ සඳහා වත්මන් පර්යේෂකයන්ට ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම
3.5.3 පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කිරීමට අවස්ථා නිර්මාණය කිරීම
3.5.4 සමකාලීන පර්යේෂණ මාතෘකා පිළිබඳ සාකච්ඡාව ප්‍රවර්ධනය කිරීම

අරමුණ 4 : ඉංග්‍රීසි අධ්‍යයනය සඳහා කැප වූ ජාතික හා ජාත්‍යන්තර ආයතනයක් ලෙස ආයතනය ස්ථානගත කිරීම

4.1 පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි විශේෂඥතාව ජාතික සංවර්ධනයට දායක කර ගත හැකි ක්ෂේත්‍ර සහ ආයතන හඳුනා ගැනීම.
4.2 පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි හි ජාත්‍යන්තර ප්‍රවේශය පුළුල් කිරීම.

උපායමාර්ග

4.1 පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි විශේෂඥතාව ජාතික සංවර්ධනයට දායක කර ගත හැකි ක්ෂේත්‍ර සහ ආයතන හඳුනා ගැනීම.

4.1.1 ප්‍රතිපත්ති සම්පාදනයේ නියැලී සිටින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධ වී ප්‍රතිපත්ති මුලපිරීම් හැඩගැස්වීම සඳහා උපායමාර්ගික යෙදවුම් සහ විශේෂඥතාව ලබා දීම.
4.1.2 ජාතික භාෂා-අධ්‍යාපනය ප්‍රතිපත්තිවලට සහාය වීම සඳහා බුද්ධිමය යෙදවුම් ලබා දීම.
4.1.3 රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල පාර්ශ්වකරුවන්ගේ වෘත්තීය සංවර්ධනයට සහාය වීම.
4.1.4 ජාතික මට්ටමේ ව්‍යාපාර සඳහා බුද්ධිමය යෙදවුම් ලබා දීම

4.2 පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි ජාත්‍යන්තර ප්‍රවේශය පුළුල් කිරීම.

4.2.1 ජ්‍යාත්‍යන්තර පශ්චාත් උපාධි සිසුන් ආකර්ශනය කර ගැනීම සඳහා නිර්මාණශීලී ප්‍රවේශයන් යොදා ගැනීම

අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන පනත මඟින් ස්ථාපිත කරන ලද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වෙනුවෙන් කැපවූ එකම පශ්චාත් උපාධි ආයතනය වන අතර, අප ආයතනය විසින් අධ්‍යාපනඥයින් හා වෙනත් වෘත්තිකයින් වෙත ඉංග්‍රීසි භාෂා සහ සාහිත්‍යය පිළිබඳ උසස් මට්ටමේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීමේ ප්‍රමුඛ භූමිකාවක් නිරූපණය කර ඇත. ප්‍රධාන පෙළේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පර්යේෂණ ආයතනයක් වශයෙන් මෙම ආයතනය කීර්ති නාමයක් ගොඩනගා ගෙන ඇත. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉගෙනුම ලද ආදි විද්‍යාර්ථීන් සියලු ජාතික විශ්වවිද්‍යාලවලම පාහේ ජ්‍යෙෂ්ඨ තනතුරු උසුලන අතර, බොහෝ දෙනා පිළිගත් විදේශ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය සහ වැඩිදුර සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය ද යොදා ගෙන ඇත.

2024 වර්ෂයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මුහුණ දුන් සැලකිය යුතු මූල්‍ය සහ මානව සම්පත් අභියෝගයන් නොතකා, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සිය ප්‍රථම ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය - International Conference on Languages, Literatures and Linguistics 2024 සාර්ථකව පැවැත්වීමට හැකි වූ අතර, එය අපගේ ගමනේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. ඊට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය කෙටි කාලීන පාඨමාලා තුනක් සහ පර්යේෂණ හුවමාරු සැසි කිහිපයක් ද සංවිධානය කරන ලදී. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය කීර්තිමත් ජාත්‍යන්තර විද්වතුන් සමඟ වැඩමුලු ද සංවිධානය කරමින්, වර්තමාන සිසුන්ට සහ ආදි ශිෂ්‍යයන්ට ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට සහ සිය ජාලයන් පුළුල් කිරීමට වටිනා අවස්ථා හිමිකර දෙන ලදී.

විදේශ රැකියා සහ විදෙස් සංක්‍රමන සඳහා දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ සුදුසුකම් වලට දැඩි ඉල්ලුමක් පවතින සන්දර්භයක් තුළ, ලෝකයේ ඕනෑම අධ්‍යන හෝ වෘත්තීයම පරිසරයකට අනුගත වීමට ශ්‍රී ලංකාවේ දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීමේ පුහුණුකරුවන්ට හැකිවනු පිණිස පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉතා උසස් තත්වයේ, සමාජ සන්දර්භයට සරිලන පශ්චාත් උපාධි සුදුසුකම් අඛණ්ඩව ලබා දෙනු ලබයි.

ආචාර්ය රොමෝලා රසූල්
අධ්‍යක්ෂ
PhD (Melbourne, Australia)
MA (Teachers College, Columbia, USA)
BA (Kelaniya, Sri Lanka)

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

අංක 1417/12 දරන 2005 ඔක්තෝබර් මස 31 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් පනවන ලද නියෝගය ප්‍රකාරව, 2005 අංක 4 දරන ආඥාපනත මඟින් මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථාපිත කරන ලදී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

1. සංවිධාන ව්‍යූහය



(අ)(i) <u>පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්</u>

	නම	තනතුරු නාමය
9 (1) (අ) අධ්‍යක්ෂ		
1	ආචාර්ය රොමෝලා රසූල්	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
9.1.(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ එම විෂය පැවරිය හැකි එවැනි වෙනත් අමාත්‍යාංශ ලේකම්වරයෙකු.		
2	සසිකා ලියනගේ මහත්මිය	අධ්‍යක්ෂ, විදේශ අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යංශය
9.1.(ඇ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව සභාපති;		
3	ආචාර්ය *බී.එල්.එෆ්. අබේවික්‍රම*	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් අධ්‍යයනාංශය කොළඹ විශ්වවිද්‍යාලය
9.1.(ඈ) විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශ ප්‍රධානි;		
4	ආචාර්ය එස්.ඒ.ඒ.කේ. සතරසිංහ	ප්‍රධානි/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
9.2. (අ) පීඨ සභාවේ නියෝජිතයෙකු		
5	ආචාර්ය එන්.සී. කුමාරසිංහ	පීඨ සභා නියෝජිත
9.2. (ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්යවරු පස්දෙනෙකු හෝ ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ වාග්විද්‍යාව (අදාල වන පරිදි) විෂයයන් ඉගැන්වීම භාර අධ්‍යයනාංශ ප්‍රධානීන්		
6	සම්මානිත මහාචාර්ය නිලූෆර් ද මෙල්	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
7	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී.ඩී.එස්. වැත්තැවෙ	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය මානව ශාස්ත්‍ර පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
8	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නෙලුක සිල්වා	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
9	මහාචාර්ය එම්. ලලිත් ආනන්ද	හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
10	පී. නාගසුන්දරම් මහත්මිය	හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
9.2. (ඇ) විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු		
11	මහාචාර්ය ජී.ආර්.ආර්. රණවක	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සෙනට් සභා නියෝජිත, සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සත්ව විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
9.2. (ඇ) අධ්‍යයන මණ්ඩල විසින් සිය සාමාජිකයින් අතුරින් පත්කරගන්නා ලද සාමාජිකයින් දෙදෙනෙකු		

12	ආචාර්ය ආර්.එල්.ඒ.එස්. රාජපක්ෂ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය - නියෝජිත, අධ්‍යයන මණ්ඩලය / දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම
13	එම්. අයි. ජැන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය - නියෝජිත, අධ්‍යයන මණ්ඩලය / දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම
9.2. (ඉ) තාක්ෂණික, අධ්‍යාපනික හෝ පරිපාලනමය ක්ෂේත්‍ර වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දෙන ලද පුද්ගලයින් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු		
14	පී. රනේපුර මහතා	හිටපු ලේකම්, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ හිටපු ලේකම්, උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය
15	දේශබන්ධු මහාචාර්ය එම්.ඒ.ඩී.එස්.ජේ.එස්.නිරිඇල්ල	පොදු හා ජාත්‍යන්තර නීති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
9.2.(ඊ) ගුරු අධ්‍යාපනය නියෝජනය වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය විසින් නම් කරනු ලබන අයෙකු		
16	ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්/ ජාතික අධ්‍යාපන ආයතනය
මහා භාණ්ඩාගාරයේ නියෝජිත		
17	කේ.ඒ. රම්‍යා කාන්ති	කොම්ප්ට්‍රෝලර් ජෙනරාල්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය

(ii) **<u>දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම සඳහා වන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යන මණ්ඩලයේ සාමාජිකයින්</u>**

	නම	තනතුරු නාමය
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂතුමා;		
1	ආචාර්ය රොමෝලා රසූල්	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2022-03-01 දින සිට)
12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුළත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාරකරු;		
2	එච්.පී.එස්.ඩී. ගුණසේකර	වැඩබලන පුස්තකාලයාධිපති/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර (2024.03.13 දක්වා)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	ආචාර්ය අග්‍රා රාජපක්ෂ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
5	එම්.අයි.ජැන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු;		
6	එම්. එෆ්. රහමතුල්ලා	දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම
7	පී.එස්. කොඩිප්පිලි ආරච්චි මහත්මිය	ද්වී භාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;		
8	ආචාර්ය සුමුදු ඇඹෝගම	ප්‍රධානී, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		
9	ආචාර්ය පී.එම්.කේ පෙරේරා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
10	ආචාර්ය එන්.කේ. අබේසේකර	භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත කුමන හෝ කාණ්ඩයකට අයත් නොවන දේශකවරු දෙදෙනෙකු;		
11	ආචාර්ය වී.වී. මැදවත්තෙගෙදර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2021-04-01 දින සිට)
12	පී. නානායක්කාර මහත්මිය	හිටපු ද්වීභාෂා අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය (2021-04-01 දින සිට)

(iii) <u>දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>

	නම	තනතුරු නාමය
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂතුමා;		
1	ආචාර්ය රොමෝලා රසූල්	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුළත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාරකරු ;		
2	එච්.පී.එස්.ඩී. ගුණසේකර මහත්මිය	වැඩබලන පුස්තකාලයාධිපති/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර (2024.03.13 දක්වා)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	ආචාර්ය අග්‍රා රාජපක්ෂ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
5	එම්.අයි.ජැන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු ;		
6	ඩී.ඒ.ඒ. ඩිමන්සි මහත්මිය	ශිෂ්‍ය නියෝජිත (ඉංග්‍රීසි භාෂාව වෘත්තීමය ලෙස හැසිරවීම)
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;		
7	ආචාර්ය ඩී.ඊ. දේවේන්ද්‍ර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
8	මහාචාර්ය වෝල්ටර් පෙරේරා	සම්මානිත මාහාචාර්‍ය/ පේරාදෙණිය විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		
9	මහාචාර්ය පී. මනුරත්න	ප්‍රධානි/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
	පී.වී.එන්. පෙරේරා මෙනවිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත සඳහන් වර්ගීකරණය යටතට නොගැනෙන ගුරුවරුන් දෙදෙනෙකු ;		
10	ආචාර්ය ආර්.එම්.සී. ජයතිලක	ප්‍රධානී / ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

(iv) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින්

ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	**ආචාර්ය රොමෝලා රසූල්** දර්ශනශූරී (ඕස්ට්‍රේලියාව)	අධ්‍යක්ෂ
2	**ආචාර්ය එච්.ඩී. විජේසේකර** දර්ශනශූරී (QUT, Australia) *(2024.03.13 දක්වා)*	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
3	**ආචාර්ය අග්‍රා රාජපක්ෂ** දර්ශනශූරී (Arizona State University)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
4	**එම්.අයි. ජැන්ස් මහත්මිය** (දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) දර්ශනපති (කැලණිය)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
5	**ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා** MHRM (කොළඹ) (2016.01.07 – 2023.05.01 හා 2024.04.18 සිට)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
6	**එස්. සී. මුණසිංහ මහත්මිය** ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (කොළඹ) (2024.08.21 දින දක්වා)	සහකාර මූල්‍යාධිකාරී
	ජී.එච්. ගාමිණී මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) (2024.08.24 දින සිට)	
7	**ජී.පී.අයි.ඩී. සිරිවර්ධන මහත්මිය**	කළමනාකාර සහකාර
8	**එච්.එන්.එන්. පෙරේරා මහතා** **(වැටුප් රහිත විදේශ නිවාඩු)**	කළමනාකාර සහකාර
9	**ඒ.ආර්.එස්.කේ. රාජපක්ෂ මහත්මිය**	කළමනාකාර සහකාර - පොත් තබන්නා
10	**ඒ.ජී.ආර්.එම්.ඩී.කේ. රණවීර මහත්මිය**	කළමනාකාර සහකාර
11	**ආර්.යූ. ජයසිංහ මහතා**	වැඩ සහායක

කොන්ත්‍රාත්ගත කාර්‍ය මණ්ඩල සාමජිකයින්

	නම	තනතුර
1	**ඊ.කේ.එන්. ධර්මරත්න මහතා** ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති (කැලණිය) සප්ත වාර්ෂික පත්කිරීම (2023.05.01 - 2024.04.17)	**නියෝජ්‍ය ලේඛකාධිකාරී**
2	**එස්.සෙනෙවිරත්න මහත්මිය** ශාස්ත්‍රපති (ලන්ඩන් යුනිවර්සිටි කොලීජිය, එක්සත් රාජධානිය) (2024.06.15 දක්වා)	**කථිකාචාර්ය**
3	**එන්.ටී. විජේගුණවර්ධන මහත්මිය** ශාස්ත්‍රපති (ගිසෙන් විශ්වවිද්‍යාලය, ජර්මනිය) (2024.12.12 දක්වා)	**කථිකාචාර්ය**
4	**පී.එම්. වැත්තෑව ශාස්ත්‍රපති**	**කථිකාචාර්ය**
5	**එස්. එල්. රණසිංහ මහත්මිය** විද්‍යාවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	**අධ්‍යයන සම්බන්ධීකාරක**
6	**ටී.ඒ.එන් ද සිල්වා මහත්මිය** විද්‍යාවේදී (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය)	**අධ්‍යයන සම්බන්ධීකාරක**
7	**බී.එම් කුමානායක මහතා** ශාස්ත්‍රවේදී (ජයවර්ධනපුර) (15.03.2024)	**ව්‍යාපෘති සහකාර**
8	**ඩබ්ලිව්.ජී.අයි.එම්. හේරත් මහතා** **කර්මාන්ත අධ්‍යනවේද (**ශ්‍රී ලංකා වි. විශ්වවිද්‍යාලය) (2024.10.15 දින දක්වා)	**මෙහෙයුම් සහකාර**

සේවක වර්ගීකරණය				
සේවා බාණ්ඩය	වැටුප් කේතය	ඇනුමත සේවක සංඛ්‍යාව	2024/12/31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව	2024/12/31 දිනට පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	PL - 1	2	1	1
ද්විතීයික මට්ටම				
කළමනාකාර සහකාර - ශිල්පීය නොවන	U - MN 1	5	4	1
තෘතීක මට්ටම				
කණිෂ්ඨ විධායක/ කළමනාකාරවරුන්	U - EX 1	1	1	1
ජ්‍යෙෂ්ඨ මට්ටම				
මධ්‍යම මට්ටමේ විධායකයින්	U - EX 2	1	1	1
කථිකාචාර්යවරුන්/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	U - AC 3	4	2	2
අධ්‍යක්ෂක	U - AC 5	1	1	
		14	**10**	**6**

2. අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීම

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ඇතුළුව බොහෝ පශ්චාත් උපාධි ආයතන සඳහා මූල්‍ය සහාය ලබා නොදීමේ රජයේ තීරණය 2024 වර්ෂයේදීද අහිතකර ලෙස බලපාන ලදී. මෙම සන්දර්භය තුළ, නව පාඨමාලා හඳුන්වා දීම සහ පවතින පාඨමාලාවල සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම මගින් සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දැඩි පීඩනයක් යටතේ සිටියදී, අභියෝගය වූයේ පිරිනමන පාඨමාලා සහ වැඩසටහන්වල ගුණාත්මක භාවය සහතික කිරීමයි.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මෙම අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වූයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යයනයන් සඳහා දායක වීමේ නව ක්‍රම සොයමින් සහ නව අදායම් මාර්ග ගවේෂණය කරමිනි. 2024 දී, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සිය සම්බන්ධතාවය ශක්තිමත් කරන ලද අතර, රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ නව ගුරුවරුන් 50 දෙනෙකුට ද්විභාෂා අධ්‍යන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිරිනමන ලදී. එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විභාෂා අධ්‍යාපන අංශය විසින් තෝරාගන්නා ලද රාජ්‍ය අංශයේ ගුරුවරුන් 100 දෙනෙකුට අන්තර්ගත සහ භාෂා ඒකාබද්ධතා ඉගෙනුම් (CLIL) පිළිබඳ කෙටි පාඨමාලා ප්‍රදානය කරන ලදී. මීට අමතරව, මියුසියස් විද්‍යාලයේ ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා CLIL පිළිබඳව සහ කොළඹ පිහිටි රාජ්‍ය නොවන සංවිධානයක් වන ක්‍රිසාලිස්හි කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය ඉංග්‍රීසි භාෂාව පිළිබඳව වෙනත් කෙටි පාඨමාලා දෙකක් ද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වන ලදී.

මේ අතර, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රමුඛ වැඩසටහන වන දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (TESL) නැවත වරක් පිරිනමන ලද අතර, ඒ සඳහා සිසුන් 78 දෙනෙකු ලියාපදිංචි වූහ. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (TLSC) දැනට වැඩිදියුණු කරමින් පවතින අතර, කාර්ය මණ්ඩල හිඟකම හේතුවෙන් ඉංග්‍රීසි භාෂාව වෘත්තීය ලෙස හැසිරවීමේ ප්‍රායෝගික පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිරිනමීම 2025 වසරේ මුල් භාගයට කල් තබන ලදී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යන කාර්ය මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය වැනි විවිධ රාජ්‍ය ආයතන සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කරමින් ගුරුවරුන් සඳහා වැඩමුළු මෙන්ම සහ ආගන්තුක සැසි පවත්වනු ලබයි. එමෙන්ම ඔවුන් බ්‍රිතාන්‍ය කවුන්සිලය වැනි වෙනත් ආයතන සඳහා ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරු අධ්‍යාපනඥ සම්මේලනය (SLELTEC) සංවිධානය කිරීමට උදව් කළ අතර ආරාධනා කරන එවැනි ආරධනා ලද විට විවිධ රාජ්‍ය විශ්වවිද්‍යාලවලටද සේවය ලබා දෙන ලදී.

පර්යේෂණ අතින් ගත් කල, 2024 වර්ෂය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කළේය - ආයතනය මෙම වසරේ දෙසැම්බර් මාසයේදී එහි මංගල ජාත්‍යන්තර සමුළුව වන ICLLL 2024 පැවැත්වීය. මෙම වැඩසටහන ජොෂ්ඨ සහ නවක

පර්යේෂකයින්, අධ්‍යාපන පරිපාලකයින් සහ ආයතනික අංශයේ හවුල්කරුවන් රැසක් එක් කරන ලද අතර ඔවුන් මුළු දවසම වැඩසටහන මගින් විනෝදයට පත්විය. උත්සවයේ ප්‍රධාන කථිකයා වූයේ කැනඩාවේ යෝර්ක් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ සහකාර මහාචාර්ය මහාචාර්ය ගේල් ප්‍රසාද් ය. මෙම සමුළුවේදී පත්‍රිකා 32 ක් ඉදිරිපත් කරන ලද අතර එයට 150 ක් පමණ සහභාගී විය. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස උත්සවයට සහභාගී විය. මෙම සමුළුවේ කටයුතු සඳහා අරමුදල් සැපයීම සඳහා ෆුල්බ්‍රයිට් කොමිසමේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පැට්‍රික් මැක්නමාරා විසින් ෆුල්බ්‍රයිට් ආදි ශිෂ්‍ය සම්මානය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂවරයාට ප්‍රදානය කිරීම කැපී පෙනෙන සිදුවීමක් විය. මෙම මංගල සමුළුවේ ජනප්‍රියතාවය සැලකිල්ලට ගෙන, 2025 දී දෙවන සමුළුව සංවිධානය කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය බලාපොරොත්තු වන අතර මෙම උත්සවය ආයතනයේ දින දර්ශනයේ ස්ථිර අංගයක් බවට පත්වනු ඇතැයි බලාපොරොත්තු වේ.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවන්ට සරිලන වැඩමුළු සංවිධානය කරමින් ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ක්ෂේත්‍රයේ සිය ස්ථානය තහවුරු කරමින් සිටී. එක්සත් රාජධානියේ ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලූක් හාර්ඩිං මහතාට සත්කාරකත්වය ලබා දුන් අතර, ඔහු පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වැඩමුළු දෙකක් පැවැත්වීය. ඉන් පළමුවැන්න පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා වූ අතර දෙවැන්න ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් හසුරුවනු ලබන ව්‍යාපෘතියක් වන විශ්වවිද්‍යාල ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය (UTEL) සැලසුම් කිරීම සහ පරිපාලනය කිරීමේ නිරත අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා විය.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ප්‍රමාණවත් අරමුදල් සහ මානව සම්පත් සහාය ලබා දෙන්නේ නම්, ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යයන සංවර්ධනයට දායක වීමට ඉතා ඉහළ ශක්‍යතාවක් ඇත. ආයතනය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ එහි කාර්ය මණ්ඩලයේ හිඟකමයි. 2024 දී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් තම තනතුරෙන් ඉල්ලා අස්වූ අතර, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දෙකක් ඉතිරි විය. ඊට අමතරව, පවතින බඳවා ගැනීමේ සීමාවන් හේතුවෙන් ආයතනයට අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දෙක පිරවීමට නොහැකි වී තිබේ. තවද, අඩු වැටුප් හේතුවෙන් රැකියාවේ රැඳී සිටීමට ඔවුන් පෙළඹෙන්නේ නැති බැවින් කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ ඉහළ පිරිවැටුමක් පවතී. මෙම තත්වය සහ රජය විසින් අරමුදල් කපා හැරීම මගින් නිර්මාණය කර ඇති මූල්‍ය ගැටළුව සමඟ, චිත්ත ධෛර්යය අඩු කිරීමට සහ උග්‍ර ගැටළුවක් බවට පරිවර්තනය වීමට ආසන්නයේ

පවතී. කෙසේ වෙතත්, කාර්ය මණ්ඩලය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා කැපවී සිටින අතර ඔවුන්ගේ කැපවීම ආයතනයේ විශාලතම ශක්තිය ලෙස පවතී.

අවම වශයෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීම සඳහා අරමුදල් ප්‍රදානය කරමින් ආයතනයට සහාය වන බවට වන අපේක්ෂා සටහනක් සමග පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2024 වර්ෂය අවසන් කරන අතර මෙමගින් ආයතනයේ විධායක නිලධාරීන් මත වූ අතිවිශාල පීඩනයක් ඉවත් වන අතර, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය රටට මෙන්ම එහි පුරවැසියන් වෙත ලබා දෙන සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට ඔවුන්ට අවකාශය ලැබෙනු ඇත.

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ශාස්ත්‍රපති උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව)

වර්ෂය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ,ශාස්ත්‍රපති උපාධිය (TESL)	දෙවන බස පසු බිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම - ශාස්ත්‍රපති උපාධිය (TLSC)	ද්වි භාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BE)	ඉංග්‍රීසි භාෂාව වෘත්තීය මය ලෙස හැසිරවීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PPE)	දර්ශන ශූරී	කෙටි පාඨමාලා	මුළු
2015 (2014/15)	140	14	-	-		64	218
2016 (2015/16)	155	19	-	-		189	363
2017 (2016/17)	176	45	-	-		169	390
2018 (2017/18)	191	56	-	-		60	307
2019 (2018/19)	193	64	40	-		27	391
2019/20	203	75	50	67		45	430
2020/21	285	107	84	45		50	568
2021/22	328	121	52	39	3	-	543
2022/23	282	113	52	45	2		494
2023/24	236	70	46	29	2	34	417
2024/25 (2024/12/31 දිනට)	228	47	56	-	2	89	422

ශිෂ්‍ය ප්‍රතිඵල

වර්ෂය		TESL PGDip	TESL MTESL	TESL MA	TLSC PGDip	TLSC MA	PPE PGDip	BE PGDip	මුළු
2018 (2017/18)		02	-	12	-	02	-	-	**16**
2019 (2018/19)		07	-	17	01	01	-	-	**26**
2020 (2019/20)		08	-	06	01	03	41	-	**59**
2021 (2020/21)		16	-	07	02	-	33	29	**87**
2022 (2021/22)		13	15	15	20	-	25	37	**125**
2023 (2022/23)		30	19	06	20	02	25	05	**107**
2024 (2022/23)	(I)	06	04	05	02	01	-	-	**18**
	(II)	18	11	-	12	02	16	33	**92**

(ආ) 2024 වර්ෂයේ සුවිශේෂී සිදුවීම්

මෙම කොටස මගින් සමාලෝචන වර්ෂය තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ළඟා කරගෙන ඇති සුවිශේෂී ආයතනික ජයග්‍රහණ පිළිබඳ කෙටි සාරාංශයක් ඉදිරිපත් කෙරේ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යසාධනය පිළිබඳ තවත් විස්තරාත්මක සහ වෙන් කළ සංඛ්‍යා දත්ත මෙම වාර්ෂික වාර්තාවේ පසු කොටස්වල දක්වා ඇත.

- කොවිඩ් වසංගතය පැවති කාල සීමාව තුළ සංවර්ධනය කරන ලද පුළුල් ගූගල් පන්ති කාමර ක්‍රමය ආයතනය විසින් අඛණ්ඩව භාවිත කරනු ලබයි. කෙසේ වෙතත්, Zoom බලපත්‍ර මිලදී ගැනීමේ පිරිවැය ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබූ බැවින්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, විවෘත විශ්වවිද්‍යාලය සමඟ සම්බන්ධවී ඉගැන්වීම් සඳහා Zoom ගිණුම් තොග වශයෙන් මිලදී ගෙන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි මාර්ගගත ඉගැන්වීම් අවශ්‍යතා සපුරාලීම සඳහා එමගින් ගිණුම් දහයක් ලබා ගන්නා ලදී. මෙම පියවර පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා සැලකිය යුතු ඉතිරියක් ඇති කිරීමට හේතුවිය. 2024 වර්ෂයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සිය ගූගල් පන්තිකාමර වැඩිදියුණු කිරීම සහ සිසුන්ට ලබා දෙන ඉගෙනුම් උපාංග වර්ධනය කිරීම කරගෙන ගිය අතර එහි අන්තර්ක්‍රියාකාරී හැකියාව ද වැඩිදියුණු කළේය. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියළුම දැනට ඉගෙනුම ලබන සහ නව සිසුන් වෙත "ousl.lk" ඩොමේනය සහිත ඔවුන්ටම සුවිශේෂී වූ විද්‍යුත් තැපැල් ලිපිනයක් ලැබේ. එකී සුවිශේෂී විද්‍යුත් තැපැල් ලිපිනය භාවිත කර ඔවුන්ට සාකච්ඡා සංසද, බහුවර්ණ ප්‍රශ්න, කෙටි පිළිතුරු ප්‍රශ්න, සමීක්ෂණ වැනි බහුවිධ ඇගයීම් ක්‍රම වලට අමතරව ඉතා උසස් මට්ටමේ වීඩියෝ සහ ඕඩියෝ සහ දෘෂ්‍ය මුද්‍රිත අන්තර්ගත මෙම ගූගල් පන්ති කාමර හා සම්බන්ධ විය හැක.

- 2022 දී ආරම්භ කරන ලද මාසික පර්යේෂණ සාකච්ඡා සැසි එනම් පර්යේෂණ සහ පිළිබිඹුව (R&R) හි සාර්ථකත්වය මත, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් 2024 වර්ෂය තුළ තවත් සැසි හයක් පවත්වන ලදී. මෙම සැසි දෙමුහුන් ආකාරයෙන් පවත්වන ලද අතර මේ සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වර්තමාන සහ පැරණි සිසුන්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යන නිලධාරීන් සහ අනෙකුත් විශ්වවිද්‍යාලවල සහෘදයන්ගේ සහභාගීත්වය ඉහල මට්ටමක පැවතුණි. සැසියේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය ඉගැන්වීමට අදාළ විවිධ ක්ෂේත්‍රවල සමකාලීන පර්යේෂණ ප්‍රවණතා පිළිබඳව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සිසුන්ට හඳුන්වාදීමයි.

2024 වර්ෂයේ පවත්වන ලද සැසිවල විස්තර පහත පරිදි වේ.

මාසය	සම්පත් දායක/ අනුබද්ධ ආයතනය	මාතෘකාව
ජනවාරි	ඔසන්කා එච්. රත්නසිරි මෙනෙවිය කථිකාචාර්ය භාෂා අධ්‍යනාංශය මොරටුව විශ්වවිද්‍යාලය	An exploration of reticence and ambivalence towards speaking English through a tri-lens of ideology, identity, and investment
පෙබරවාරි	Dr. Asri Nurul Qadri, Associate Global Educator Global Launch Arizona State University, USA	Documenting Realities of a Multilingual Family with Autism Spectrum Disorders in Using a Behavior Logging App: A Linguistic Ethnographic Case Study
අප්‍රේල්	Associate Prof. Melissa E. Schindler Associate Professor of English, University of North Georgia	From the classroom to the cemetery: Innovative approaches to making learning "real"
අගෝස්තු	Prof Shahid Abrar-ul-Hassan Professor (English Language and Communications) Yorkville University, British Columbia Campus in New Westminster, BC, Canada	Language Assessment Literacy for Learner – Centered Instruction
ඔක්තෝබර්	ආචාර්ය කේතකී නාගහවත්ත, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය	Opportunities and challenges of using stories of experiences in ELT research: Insights from a narrative researcher’s journey

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රතිව්‍යුහගත කරන ලද දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ පස්වන කණ්ඩායම සඳහා වන තේරීම් පරීක්ෂණය 2024 සැප්තැම්බර් 05 වන දින පවත්වන ලදී. අයදුම්පත් 127ක් ලැබුණු අතර ඔවුන් විවෘත විශ්වවිද්‍යාල පරීක්ෂණ ශාලාවේ පැවැත්වූ තේරීම් පරීක්ෂණයට පෙනී සිටියේය. මෙම වැඩසටහන සඳහා සමාරම්භක උත්සවය සහ ලියාපදිංචි කිරීම 2024 ඔක්තෝබර් 16 වන දින පැවැත්විණි. 2024/25 කණ්ඩායම සඳහා සිසුන් 78 දෙනෙකු ලියාපදිංචි විය.

2024 ඔක්තෝබර් 02 වන දින ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ සිය සිව්වන කණ්ඩායමේ සමාරම්භක උත්සවය ගුරු ශිෂ්‍ය සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම ශිෂ්‍ය-ගුරුවරුන් 50 දෙනා සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුග්‍රහය දක්වන ලද්දේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇති කර ගත් අවබෝධතා ගිණුමක කොටසක් ලෙසයි.

ඊට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යන සහ පරිපාලන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලද

<u>සාමාන්‍ය අධ්‍යන කටයුතු</u>

ශාස්ත්‍රපති උපාධිය සඳහා වාචික පරීක්ෂන 7ක් වසර තුළ පවත්වන ලදී. ඉන් 3ක් දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා වන අතර 4ක් දෙවන බස පසු බිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා වේ.

2024 අගෝස්තු 28 වන දින පැවැති උපාධි ප්‍රාදානෝත්සවයේදී සිසුන් 110 දෙනෙකු උපාධි ලබා ගන්නා ලද අතර මෙයට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වනු ලබන වැඩසටහන් 4 හිම සිසුන් ඇතුළත් විය.

<u>පරිපාලන ක්‍රියාකාරකම් සහ ප්‍රවේශයන්</u>

2024 වසරේදී, පෙර වර්ෂ වලදී බලපෑ කොවිඩ් වසංගතය සහ ඉන් පසුව ඇති වූ දේශපාලන හා ආර්ථික කැලඹීම් හේතුවෙන් ඇති වූ බාධාවන්ගෙන් පසු, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පරිපාලන හා අධ්‍යයන කාර්ය මණ්ඩලය කාර්යාලයේ සාමාන්‍ය වැඩ කරන වේලාවන්ට සේවයට වාර්තා කිරීම දක්නට ලැබුණි.

2023.05.02 දින සිට වසරක කාලයක් සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා සිය සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන 2024.04.18 දින නැවත සේවයට වාර්තා කරන ලදී.

2023 වසරේ මූල්‍ය වාර්තාව 2023 වාර්ෂික වාර්තාව සමඟ පෙබරවාරි 28 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. 2024 වර්ෂය සඳහා ගබඩා සහ ස්ථාවර වත්කම්වල වාර්ෂික සත්‍යාපනය ද අවසන් කර ඇත. 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024 ඔක්තෝබර් 10 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දෙන ලදී.

පළමු ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එච්. ඩී. විජේසේකර මහත්මිය 2024.03.14 දින ඉල්ලා අස්විය. තවත් එක් පුරප්පාඩු තනතුරක් පවතින අතර එය කඩිනමින් පිරවිය යුතුය.

අනධ්‍යන කාර්යමණ්ඩලයේ, එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වැටුප් රහිත නිවාඩු ලබාගෙන එක්සත් රාජධානියේ රැකියාවක් සඳහා පිටත්ව යන ලදී. ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම සඳහා පනවා ඇති සීමාවන් තවමත් අභියෝගයක් ලෙස පවතී, මන්ද අනධ්‍යයන

කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දෙකක් (පරිගණක යෙදුම් සහකාර 1, කාර්යාල සහායක 1) කඩිනමින් පිරවිය යුතුය.

2025.03.01 දින සිට ආරම්භ වන ඉදිරි වසර තුන (03) සඳහා අධ්‍යක්ෂවරයෙකු තෝරා ගැනීම සඳහා විශේෂ කළමනාකරණ මණ්ඩලයක් ඇතුළුව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය 2024 වර්ෂය තුළ අවස්ථා 10 කදී රැස්විය.

රැස්වීම් දෙමුහුන් ආකාරයෙන් පවත්වන ලද බැවින්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට මාර්ගගතව හෝ මුහුණට මුහුණ රැස්වීම්වලට සහභාගී වීමේ විකල්පය ඉදිරිපත් කරන ලදී. 2024 වර්ෂය සඳහා දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම/ද්වී භාෂා අධ්‍යාපනය සඳහා අධ්‍යයන මණ්ඩලයේ සහ දෙවන බස පසු බිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම/ ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම යන පාඨමාලාවල අධ්‍යයන මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වන ලදී.

ආයතනයේ බොහෝ ක්‍රියාවලීන් තවමත් මැනුවල් ආකාරයට සිදු කරනු ලබන බැවින්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කළමනාකරණ තොරතුරු පද්ධතියක (MIS) දැඩි අවශ්‍යතාවක් පවතී. කෙසේ වෙතත්, එවැනි පද්ධතියක් හඳුන්වාදීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට එහි පවතින වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම සහ මූලික පියවරක් ලෙස වෙබ් අඩවිය හරහා ගෙවීම් දොරටුවක් හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා සාකච්ඡා සිදුවෙමින් පවතින අතර 2025 දී ගතික නව වෙබ් අඩවියක් දියත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

මූල්‍ය

මෙම වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, 2024 වර්ෂය තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත 13% රාජ්‍ය අරමුදල් ලබා දී ඇත.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	Note	2024	2023 (Restated)	2023
		Rs.	Rs.	Rs.
ආදායම				
ජංගම				
විනිමය නොවන ගණුදෙනු වලින් ලද ආදායම - ජංගම				
රජයේ පුනරාවර්තන ප්‍රධාන		5,820,000	3,750,000	3,750,000
විවිද ලැබීම්		635,792	141,228	141,228
විනිමය නොවන ගණුදෙනු වලින් ලද මුළු ආදායම - ජංගම		**6,455,792**	**3,891,228**	**3,891,228**
විනිමය ගණුදෙනු වලින් ලද ආදායම - ජංගම				
අයදුම්පත් ගාස්තු		518,000	397,000	397,000
ලියාපදිංචි ගාස්තු		585,100	464,900	464,900
පන්ති ගාස්තු		10,525,226	13,595,455	13,595,455
විභාග ගාස්තු		1,693,465	844,315	844,315
පරිපූරක ගාස්තු		324,800	314,200	314,200
නිබන්ධන ගාස්තු		1,959,500	1,526,800	1,526,800
කළඹ ගාස්තු		42,500		
ප්‍රායෝගික ඉගැන්වීම් ගාස්තු		1,320,014		
කෙටි පාඨමාලා ගාස්තු		2,569,848	983,336	983,336
පොළී ආදායම	14	9,798,336	17,888,886	17,909,042
පිටපත්, සහතික ගාස්තු		107,300		
ජාත්‍යන්තර සමුළුව		763,420		
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය			-	8,735,280
විනිමය ගණුදෙනු වලින් ලද ආදායම - ජංගම		**30,207,509**	**36,014,892**	**44,770,328**
මුළු අදායම - පුනරාවර්තන		**36,663,301**	**39,906,120**	**48,661,556**
ප්‍රාග්ධන				

විනිමය නොවන ගණුදෙනු වලින් ලද ආදායම - ප්‍රාග්ධන				
පුනරුත්තාපන කටයුතු සඳහා රජයේ ප්‍රදාන පුනරාවර්තන		-		
දේශීය සහ විදේශීය ත්‍යාග සහ පරිත්‍යාග		-		
මුළු අදායම - ප්‍රාග්ධන		-	-	-
මුළු ආදායම		**36,663,301**	**39,906,120**	**48,661,556**
වියදම්				
ජංගම				
පුද්ගලික පඩිනඩි	**15**	34,256,958	36,011,727	36,011,727
ගමන් වියදම්	**16**	149,477	173,988	173,988
සැපයුම් සහ පරිභෝජන භාණ්ඩ	**17**	609,493	753,288	753,288
නඩත්තු වියදම්	**18**	1,200,489	583,886	583,886
කොන්ත්‍රාත් සේවා	**19**	1,032,292	956,610	956,610
වෙනත් පුනරාවර්තන වියදම්	**20**	5,648,632	7,085,241	7,085,241
පාරිතෝෂික වියදම්		1,529,519	668,746	2,597,195
මානව ප්‍රාග්ධන වියදම්				
ප්‍රතිමූල්‍යකරණ හිඟය				
මුළු වියදම් (ප්‍රාග්ධන නොවන ස්වභාවයේ)		**44,426,859**	**46,233,486**	**48,161,935**
ප්‍රාග්ධන				
ක්ෂයවීම්		9,280,633	8,967,152	8,967,152
අස්පර්ශනීය වත්කම් ක්‍රමක්ෂය		118,000	118,000	118,000
මුළු වියදම් (ප්‍රාග්ධන ස්වභාවයේ)		**9,398,633**	**9,085,152**	**9,085,152**
මුළු වියදම්		**53,825,492**	**55,318,638**	**57,247,087**
වසර සඳහා අතිරික්තය/හිඟය		**(17,162,191)**	**(15,412,517)**	**(8,585,530)**
වසර සඳහා අතිරික්තය/(හිඟය) - ජංගම		(7,763,558)	(6,327,365)	(8,585,530)
වසර සඳහා අතිරික්තය/(හිඟය) - ප්‍රාග්ධන		(9,398,633)	(9,085,152)	
		(17,162,191)	**(15,412,517)**	**(8,585,530)**

(ඇ) අභියෝග

2024 වර්ෂයේ දී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මුහුණ දුන් බරපතලම අභියෝගය වූයේ අරමුදල් නොලැබීමයි. රජයෙන් ලැබෙන අරමුදල් ආධාර ක්‍රමයෙන් අඩු වෙමින් පැවතුනද, 2024 වර්ශයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සහ තවත් පශ්චාත් උපාධි ආයතන කිහිපයක් සඳහා රජය විසින් 87% කින් පමණ අරමුදල් අහෝසි කරන ලදී. මෙය 2024 වර්ෂය සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හිඟයක් වාර්තා කිරීමට හේතු විය.

තවත් අභියෝගයක් වන්නේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට අවසර නොදීමයි. ආයතනයක් සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත් සහ බාහිර කාර්ය මණ්ඩලය මත යැපෙන විට ස්ථාවර සහ තිරසාර පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම අභියෝගයකි. මෙම කාර්යමණ්ඩල සාමාජිකයින්ට ගෙවනු ලබන වැටුප් වර්තමාන වෙළඳපොලේ අයදුම්කරුවෙකු සතු සුදුසුකම් වලට වඩා අඩු බැවින්, කාර්ය මණ්ඩලයේ ඉහළ පිරිවැටුමක් නොමැති අතර එය ආයතනයට හිතකර නොවේ.

රජයේ මෙම මූල්‍ය හා මානව සම්පත් සම්බන්ධ තීරණවල ප්‍රතිවිපාක අහිතකර වේ. සිය අනාගතය සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාව හේතුවෙන්, අධ්‍යයන සහ අනධ්‍යයන යන දෙඅංශයෙන්ම සමන්විත ස්ථිර කාර්යමණ්ඩලය අධෛර්යයට පත්ව ඇත. විභව අපේක්ෂකයින් මෙම අවිනිශ්චිතතාවයට මුහුණ දීමට පැකිළීම හේතුවෙන් ස්ථිර පදනමින් දක්ෂ අධ්‍යන නිළධාරීන් ආකර්ෂණය කරගැනීම පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ගැටලුකාරී වී ඇත.

අනෙක් අතට දැනට පවතින පාඨමාලා සංඛ්‍යාව වැඩි කිරීමට සහ පවතින පාඨමාලාවල සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම මගින් දැනට සිටින කාර්යමණ්ඩලයට නිරන්තර පීඩනයට ලක්වේ. කුඩා අධ්‍යන නිළධාරීන් පිරිසක් සිටින බැවින්, ගුණාත්මක භාවය අඩු නොකර මෙය සිදු කිරීම පහසු නොවනු ඇත.

ජනතාව මුහුණ දෙන වත්මන් ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගෙන, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ද සිසුන්ගෙන් අය කරන ගාස්තු (සාම්ප්‍රදායික වාර්ෂික වැඩිවීම හැර) වැඩි කිරීමට මැලිකමක් දක්වයි. රටෙහි සුවිසල් කාර්‍ය වපසරිය තුළ අපගේ කාර්යභාරය පිළිබඳව අපි දැනුවත්ව සිටින අතර, එබැවින් අපගේ අධ්‍යාපනයට ප්‍රවේශය හැකි තරම් දැරිය හැකි මට්ටමක තබා ගැනීමට ඇපි කැප වී සිටිමු.

(ඇ) අනාගත සැලසුම්

වර්තමානයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මුහුණපානු ලබන මූල්‍ය අවහිරතාවන් තිබියදී, ආයතනයට සිය පද්ධතිවල අවශ්‍ය වෙනස්කම් සිදු නොකර වේගවත්, නිවැරදි සහ තිරසාර ආකාරයකින් සිය සිසුන්ට සහාය විය නොහැකි බව වඩ වඩාත් පැහැදිලි වේ. එබැවින් අනාගතයේදී ආයතනයට නවීන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සඳහා ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.

තවද, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ/දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ වෙළෙඳපොළ තුළ සමකාලීන අවශ්‍යතා සපුරාලන පාඨමාලා සැලසුම් කිරීම මගින් ආයතනය පිරිනමන කෙටි කාලීන පාඨමාලාවලට එකතු කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය බලාපොරොත්තු වේ. ආයතනය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය වැනි ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ සේවා සපයන්නන් සමඟ සහයෝගයෙන් ජාත්‍යන්තරව පිළිගත් පාඨමාලා ලබාදීමේ ක්‍රම ගවේෂණය කිරීමට බලාපොරොත්තු වේ.

2024 වසර තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අපේක්ෂා කරන තවත් විකල්පයක් වන්නේ ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට විදේශයන්හි සිටින අය සඳහා ආරාධනා කිරීමේ හැකියාව සොයා බැලීමයි. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා මාලදිවයිනේ ශිෂ්‍ය-ගුරුවරුන්ට ඇතුළත් කර ගැනීමට හැකියාවක් පවතින බව හඳුනාගෙන ඇති අතර මෙම හැකියාව ඉදිරි වර්ෂයේදී තවදුරටත් විමර්ශනය කිරීමට නියමිතය.

(ඉ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවත්වන පාඨමාලා හා ශිෂ්‍යයින්ගේ විස්තර

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් පිරිනමන අධ්‍යාපනික වැඩසටහන්වල සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් හා මෙම පාඨමාලා සඳහා බඳවාගෙන ඇති ශිෂ්‍යයින්ගේ සංඛ්‍යා දත්ත පහත සඳහන් පරිදි වේ:

පූර්ණ කාලීන වැඩසටහන්

අ. පර්යේෂණ මගින් සිදු කරන පශ්චාත් උපාධි පාඨමාලා

1. දර්ශනශූරී උපාධිය
2. දර්ශනපති උපාධිය

ආ. පාඨමාලා සහ පර්යේෂණ අංගද ඇතුළත් පශ්චාත් උපාධි

3. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
4. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන්

1. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
2. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
3. ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
4. ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව

වැඩසටහන	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව
දර්ශනශූරී උපාධිය	2
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TESL)	47
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (M in TESL)	26
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (PG Dip./MA in TESL) - නව	120
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (PG Dip./MA in TESL) - පැරණි	35
දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TLSC)	47
ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip. in BE)	56
ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-
ශාස්ත්‍රීය ලේඛනකරණය පිළිබඳ කෙටි පාඨමාලාව	47
ක්‍රිසාලි (Chrysaly) සඳහා වෘත්තීය සන්නිවේදනය පිළිබඳ කෙටි පාඨමාලාව	24
අධ්‍යයන සාක්ෂරතාවය සහ අන්තර්ගතය සහ භාෂා ඒකාබද්ධ ඉගෙනීම (CLIL) පිළිබඳ කෙටි පාඨමාලාව	**18**
එකතුව	**422**

අධ්‍යයන වර්ෂ මඟින් වෙන්කරන ලද පූර්ණකාලීන වැඩසටහන්වලට සම්බන්ධ වී සිටින ශිෂ්‍යයින්ගේ විස්තර

<table>
<tr><th colspan="2">පාඨමාලාව</th><th>ඇතුළත් කර ගැනීම් 2023</th><th>පළමු වසරේ ශිෂ්‍යයින් (I කොටස)</th><th>දෙවන වසරේ ශිෂ්‍යයින් (II කොටස)</th><th>උපාධිය ලත් සංඛ්‍යාව</th></tr>
<tr><td colspan="2">දර්ශනශූරී උපාධිය/ දර්ශනපති උපාධිය</td><td>-</td><td>-</td><td>02</td><td>-</td></tr>
<tr><td colspan="2" rowspan="3">දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ ශාස්ත්‍රපති උපාධිය</td><td rowspan="3">59</td><td rowspan="3">128</td><td rowspan="3">95</td><td>PG Dip - 13</td></tr>
<tr><td>MTESL - 15</td></tr>
<tr><td>MA in TESL - 15</td></tr>
<tr><td colspan="2">දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය</td><td>23</td><td>52</td><td>38</td><td>PG Dip – 20
MA in TLSC - 0</td></tr>
<tr><td colspan="2">ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව</td><td>-</td><td>44</td><td>8</td><td>PGDip - 37</td></tr>
<tr><td colspan="2">ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව</td><td>43</td><td>2</td><td>-</td><td>PGDip - 25</td></tr>
<tr><td>මුළු එකතුව</td><td>05</td><td>125</td><td>226</td><td>143</td><td>PGDip -95
M -15
MA -15</td></tr>
</table>

තමා සතුව ඇති කායීන් මත පදනම්ව සිසුන්ට පාඨමාලා තෝරාගැනීම සඳහා පහසුකම් සලසනු ලබන විවෘත සහ දුරස්ථ ඉගෙනුම් ක්‍රියාවලියක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් යොදාගනු ලබයි. එමනිසා ඔවුන්ට පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා උපරිම වසර 6 ක හෝ 7 ක කාලයක් ලබාදෙනු ඇත.

ශිෂ්‍ය කාර්යසාධනය

පහත දැක්වෙනුයේ, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වනු ලබන පූර්ණකාලීන වැඩසටහන්හි ශිෂ්‍යයින් විසින් පාඨමාලාමය වශයෙන් පෙන්නුම් කර ඇති කාර්යසාධනය පිළිබඳ විස්තරය වේ.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මිශ්‍රිත අධ්‍යාපන ක්‍රමවේදයක් (දුරස්ථ + මුහුණට මුහුණ වශයෙන්) අනුගමනය කරන හෙයින්, ලියාපදිංචි වූ දිනයේ සිට වසර 06ක් දක්වා කාලයක් තුළ

සිසුන්ට පාඨමාලාවක් සම්පූර්ණ කළ හැකිය. මෙය දුරස්ථ අධ්‍යාපන ක්‍රමයට ආවේණික නම්‍යශීලීබවෙහි අංගයකි. එම නිසා, උපාධිය සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා, තමන් නියම වශයෙන් ලියාපදිංචි වී ඇති පාඨමාලා සම්පූර්ණ කරන ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව මගින් ශිෂ්‍යයින්ගේ (හා ආයතනික) කාර්යසාධනය පිළිබඳ වඩා යහපත් දර්ශකයක් ලබා දෙයි.

ඉගෙනුම් ලාභියා වෙත ලැබෙන සහාය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය යෝජනා ඉදිරිපත් කිරීමට සූදානම් වන පර්යේෂණ සිදු කරනු ලබන ශිෂ්‍යයින් වෙනුවෙන් එම ශිෂ්‍යයින් සමඟ මාර්ගගතව සාකච්ඡා පවත්වා, ප්‍රතිපෝෂක ලබා දෙන ලදී. මෙය කාලය හා බද්ධ වූ ක්‍රියාවක් මෙන්ම එකිනෙකට වෙනස් ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් දෙකක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු හෙයින්, වඩාත් අවධානය යොමු කරන ලද උසස් මට්ටමේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයින්ට සහාය ලබාදීමේදී එය සාර්ථක උපායමාර්ගයක් බව සනාථ කර ඇත.

(ඊ) සමාලෝචනයට යටත් වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර

පූර්ණකාලීන හා කෙටිකාලීන පාඨමාලා හැර, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ. එම ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විස්තරයක් දක්වා ඇත.

- මිශ්‍ර මාදිලියකට පහසුකම් සැලසීම සඳහා ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනේ ඉගැන්වීමේ ප්‍රායෝගික අදියර 1 ප්‍රතිව්‍යුහගත කිරීම.
- දැඩි ලෙස උපදේශනය කරන ලද සහ අධීක්ෂණය කරන ලද මාර්ගගත ඉගැන්වීම් පුහුණුවකට පහසුකම් සැලසීම සඳහා ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනේ ඉගැන්වීමේ ප්‍රායෝගික අදියර 2 ප්‍රතිව්‍යුහගත කිරීම.
- දේශගුණික වෙනස්වීම් සහ දේශගුණික ක්‍රියාකාරකම් පිළිබඳ අර්තා සල්ගාදු මහතා විසින් අරාධිත දේශනයක් සිදුකරන ලදී. ඔහුගේ දේශනය දේශගුණික අර්බුදය පිළිබඳ දළ විශ්ලේෂණයක්, පැරිස් ගිවිසුමේ බැඳීම් සහ ලෝකය අඩු කාබන් ආර්ථිකයකට සංක්‍රමණය වීමත් සමඟ අපනයන වෙළඳ පොළට ඇති අවදානම් සහ අවස්ථා පිළිබඳ සාකච්ඡාවක් ඉදිරිපත් කළේය. මෙය ඉතා විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලැබූ දෙමුහුන් ඉසව්වක් විය. ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනට අගය එකතු කිරීමේ ආකාරයක් ලෙස මෙම දේශනය සංවිධානය කරන ලදී.

(උ)　　**මානව සම්පත්**

දැනට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතු මානව සම්පත පහත පරිදි වේ.

අනුමත සමස්ථ ස්ථිර කාර්‍යමණ්ඩලය - 14

- සත්‍ය සේවක සංඛ්‍යාව - 10 සහ කොන්ත්‍රාත් සේවක මන්ඩලය - 05
- පුරප්පාඩු - 04

අධ්‍යයන කාර්යමණ්ඩලයේ විස්තර

ආයතනය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	පරිවාස කාලසීමාවේ සිටින කථිකාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය (කොන්ත්‍රාත්)
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය	ඉංග්‍රීසි	-	-	03	-	-	02*
එකතුව	**-**	**-**	**-**	**03**	**-**	**-**	**02**

*** කොන්ත්‍රාත් පදනම මත කථිකාචාර්ය**

අනධ්‍යයන කාර්යමණ්ඩලයේ විස්තර

ආයතනය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	සුළු සේවකයින්	කොන්ත්‍රාත් කාර්‍ය මණ්ඩලය
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය	-	02	03	01	03
මුළු	**-**	**02**	**03**	**01**	**03**

කාර්ය මණ්ඩලයේ පර්යේෂණ, නව සොයාගැනීම් හා ප්‍රකාශන පිළිබඳ විස්තර

1. ආචාර්ය රොමෙලා රසූල් - අධ්‍යක්ෂ - PhD (Australia)

ජාතික දායකත්වයන්

- Member of the Official Languages Commission of Sri Lanka.
- Represented Sri Lanka at the South Asia Higher Education Symposium organized by the Hollings Center, USA in Istanbul, Turkiye.
- Conducted several Training of Trainer workshops for the Bilingual Education division of the Ministry of Education.

ඉදිරිපත්කිරීම්/සම්මන්ත්‍රණ

- Conducted a pre-conference seminar for the Open University Research Symposium 2024.
- Was an invited speaker at the international seminar titled *"Language Teaching, Research and Policy: Lessons Learnt and the Way Forward"* conducted by the University of Colombo.
- Facilitator and Panelist at the Sri Lanka English Language Teacher Educators Conference (SLELTEC).
- Chaired academic sessions on English Language Teaching at the Open University Research Seminar (OURS) 2024.

ප්‍රාදානයන්

- Won a Fulbright Alumni Small Grant offered by the US-SL Fulbright Commission.

පයේෂණ හා සම්බන්ධ වැඩසටහන් සංවිධානය

- Chairperson of the Organizing Committee of the International Conference on Languages, Literatures and Linguistics 2024 organised by the PGIE.

නිබන්ධන පරීක්ෂාව

- Served as external examiner of Ms. Udumbara Samarakoon's PhD thesis submitted to Hiroshima City University, Japan.
- Served as Examiner of MA thesis submitted to the Department of English, University of Colombo.

සාරාංශ/ලිපි සමාලෝචනය කිරීම

- Reviewed journal article for the Vidyodaya Journal of Humanities and Social Sciences, University of Sri Jayewardenepura
- Reviewed journal article for the Kalyani journal of the University of Kelaniya.
- Reviewed article for the OUSL journal
- Reviewed article for the Journal of Multidisciplinary and Translational (JMTR) of the University of Kelaniya.
- Reviewed abstracts for the OURS conference book.
- Reviewed abstracts and coordinated abstracts reviewing process for SLELTEC 2024.

3. එම්. අයි. ජැන්ස් මහත්මිය - ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය - MPhil (Kelaniya)

ප්‍රකාශන

B.R. Schrieber, 'Global Englishes-oriented teacher education: lasting shifts. ELT Journal, "ELT Journal. Volume 79, Issue 1, January 2025, Pages 35–43, https://doi.org/10.1093/elt/ccae027

සමුළු, සාරාංශ සමාලෝචනය කිරීම

1. iConArts2024
2. IRCHSS25
3. ICLLL24
4. IRCOUSL2024
5. SLELTEC24

මණ්ඩල ප්‍රමාණකරු

International Seminar on LanguageTeaching, Research,and Policy: Lessons Learnt and the Way Forward Organized by DELT UOC.

අධ්‍යන දායකත්වයන් - ජාතික
1. OUSL Journal Editorial Board
2. Member- Research Awards Senate Sub Committee Ethics Review (OUSL)

1. Committee member - Industry Liason
2. Advisory Board Member and Paper Review – TESOL Journal
3. Treasurer - SLACLALS
4. Visiting Academic - SEUSL, University of Kelaniya
5. Convenor - organizing committee - ICLLL24

3. ආචාර්ය අග්‍රා රාජපක්ෂ - ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය PhD (Arizona State University)

ප්‍රකාශන

Warriner, D. ,S., Griego and A. Rajapakse, 'Multilingual literacies: Routledge Handbook of Multilingualism,p.160-175, Routledge Handbook Series.

සමුළු සාරාංශ සමාලෝචනය කිරීම

1.ICLLL24

2.IRCOUSL2024

3.SLELTEC24

මණ්ඩල ප්‍රමාණකරු

International Seminar on LanguageTeaching, Research,and Policy: Lessons Learnt and the Way Forward Organized by DELT UOC.

අධ්‍යන කටයුතු සඳහා දායකත්වයන් - ජාතික
1. OUSL Journal – Manuscript review

2. Member of the PGIE Ethics Review Sub-committee of the ERC OUSL

3. Best Researcher Award - OUSL

4. අනාගත තිරසර සංවර්ධන අපේක්ෂාවන්

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පහත සඳහන් තිරසාර සංවර්ධන ඉලක්ක එහි කාර්යයට සෘජුවම අදාළ යැයි හඳුනාගෙන ඇත:

ඉලක්කය 4 – ගුණාත්මක අධ්‍යාපනය

ඉලක්කය 16 – සමගිය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

මෙම ඉලක්ක දෙක සමග පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සම්බන්ධව කටයුතු කිරීම සහ දායක වූ නිශ්චිත ක්‍රම පහත දක්වා ඇත

ඉලක්කය 4 – ගුණාත්මක අධ්‍යාපනය

ඉලක්කය 4 යටතේ පහත සඳහන් ඉලක්ක පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යය මගින් ආමන්ත්‍රණය කරනු ලැබේ.

1. වසර 2030 වන විට, රැකියා, ගෞරවනීය රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික සහ වෘත්තීය කුසලතා ඇතුළු අදාළ කුසලතා ඇති තරුණ තරුණියන් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම
2. වසර 2030 වන විට, අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ අසමානතා තුරන් කර, ආබාධ සහිත පුද්ගලයන්, ආදිවාසීන් සහ අවදානමට ලක්ව ඇති තත්ත්වයන්හි සිටින දරුවන් ඇතුළු අවදානමට ලක්වන අයට අධ්‍යාපනයේ සියලුම මට්ටම් සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශය සහතික කිරීම
3. වසර 2030 වන විට, විශේෂයෙන් අවම සංවර්ධිත රටවල් සහ සංවර්ධනය වන කුඩා දූපත් රාජ්‍යයන්හි ගුරු පුහුණුව සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය හරහා, සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩි කිරීම

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මෙම ඉලක්ක සඳහා දායක වූ ආකාරය:

1. ඉලක්ක 1 සහ 3 පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දැනට පවතින ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් දෙක මගින් ආමන්ත්‍රණය කර ඇත: දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධිය (MA TESL) සහ (දෙවන භාෂා සන්දර්භයක් තුළ) සාහිත්‍යය ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධිය (MA TLSC).

   වැඩසටහන් දෙකේම මූලික ඉලක්ක කණ්ඩායම වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය, පෞද්ගලික සහ අර්ධ පෞද්ගලික අධ්‍යාපන අංශවල ගුරුවරුන්ය. සමහර සිසුන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය රැකියා ලබා ගැනීම සඳහා භාවිතා කර ඇති අතර අනෙක් අය එය උසස්වීම් සහ විදේශගත වැඩිදුර පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ඉල්ලුම් කිරීම වැනි වෘත්තීය ප්‍රගතිය සඳහා භාවිතා කර ඇත.

   පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සපයනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපනයේ අදාළත්වය සහ ගුණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා 2020 දී සිය දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධි (MA TESL) වැඩසටහන ප්‍රතිව්‍යුහගත කරන ලදීමෙමගින් වැඩසටහනට . ප්‍රවේශ වන ගුරුවරුන්ට

වැඩි නම්‍යතාවයක් ලබා දෙනු ඇත, මන්ද ඔවුන්ට පර්යේෂණ ව්‍යාපෘතියක නිරත වීමේ අවශ්‍යතාවයෙන් නිදහස්ව දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip TESL) හෝ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධි (MTESL) සුදුසුකම සහිතව පිටව යා හැකි බැවිනි.

2. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, 2018 සහ 2019 යන වසරවලදී ආරම්භ කරන ලද නව පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙකක් සංවර්ධනය කරන ලදී. මෙම වැඩසටහන් දෙකම රටේ ඉංග්‍රීසි අධ්‍යාපනය වර්ධනය කිරීමට ඍජුවම දායක වේ.

   ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip BE) ශ්‍රී ලංකාවේ එකම ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන වන අතර, ඉංග්‍රීසියෙන් සහ සිය මවු බසින් අන්තර්ගත විෂයන් ඉගැන්වීමට හැකි නව පරම්පරාවේ ගුරුවරුන් සංවර්ධනය කිරීම සඳහා අන්තර්ගත සහ භාෂා ඒකාබද්ධතා ඉගෙනුම් (CLIL) ක්‍රමවේදය භාවිතා කරයි. මෙමගින් සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩිදියුණු කිරීමට ඍජුවම ප්‍රයෝජන ලැබෙනු ඇත.

   ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip PPE) ඉංග්‍රීසිය සඳහා සන්නිවේදන පදනම් කරගත් ප්‍රවේශයක් ලබා දෙන අතර, රැකියා සොයන තරුණ තරුණියන් සහ වෘත්තීය ජීවිතයේ මුල් අවධියේ සිටින වෘත්තිකයන් වැඩි ප්‍රතිලාභී රැකියා ලබා ගැනීමට සහ සමාජයේ ඵලදායී පුරවැසියන් වීමට ඉංග්‍රීසි පදනම් කරගත් සන්නිවේදන කුසලතා ලබා ගැනීම සඳහා සවිබල ගැන්වීම ඉලක්ක කරයි.

ඉලක්කය 16 – සමගිය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

1. ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ත්‍රස්තවාදය හා අපරාධ මර්දනය කිරීම සඳහා, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල්හි, සියලුම මට්ටම්වල ධාරිතාව ගොඩනැගීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය හරහා අදාළ ජාතික ආයතන ශක්තිමත් කිරීම
2. තිරසාර සංවර්ධනය සඳහා විශමතාවන් රහිත නීති සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2018 සහ 2019 වර්ශවලදී දී බ්‍රිතාන්‍ය කවුන්සිලයෙන් කලා සහ ප්‍රතිසන්ධානය පිළිබඳ පර්යේෂණ ප්‍රදානයක් ලබා ගැනීමෙන් ඉලක්ක 1 සහ 2 සඳහා දායක වී ඇති අතර, එමගින් බෙල්ෆාස්ට් හි ක්වීන්ස් විශ්ව විද්‍යාලයේ සෙනෙටර් ජෝර්ජ් ජේ මිචෙල් ගෝලීය ආරක්ෂාව සහ සාමය සඳහා වන ආයතනය සමඟ සහයෝගීතාවයක් ද ඇති කර ගෙන තිබේ. යහපත් මූල්‍ය ශක්තියක් සමඟ සාපේක්ෂ වශයෙන් ආයතනය සාමාන්‍ය තත්ත්වයකට ළඟා වන විට 2025 වර්ෂයේ සිට ආයතනය තවදුරටත් විකල්ප ගවේෂණය කිරීමට සැලසුම් කරයි.

අභ්‍යන්තර විගණන වාර්තාව

අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අදාල ක්ෂේත්‍රවල පහත සඳහන් පරිදි සැලකිය යුතු ක්ෂේත්‍රයක් ආවරණය කරමින් සිය විගණන කටයුතු සිදු කරන ලදී.

1. පූර්ව විගණන

- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල නිදහස් කිරීම
- පාරිතෝශිත ගෙවීම්
- විශ්‍රාම අරමුදල නිදහස් කිරීම
- කොන්ත්‍රාත් සඳහා අවසන් ගෙවීම් සහ රඳවාතබා ගැනීම් නිදහස් කිරීම

2. සොයාගැනීම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන විමසුම්

    1. 2023 වර්ෂය සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ භාණ්ඩ තොග සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ වාර්තාව - VV/19/AQ/2024/PGIE/01
    2. 2023/2024 වර්ෂ සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රසම්පාදන පිළිබඳ විගණන වාර්තාව - VV/19/AQ/2023/PGIE/02

3. **විගණන කමිටුව**

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ විගණන කමිටුව ආයතනයේ කටයුතු සමාලෝචනය කිරීම සඳහා අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්වේ. විගණකාධිපති සහ අභ්‍යන්තර විගණන ඒකකය විසින් එවනු ලබන විගණන වාර්තා සහ විගණන විමසුම් මෙන්ම එකී විගණන විමසුම් සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පිළිතුරු, කමිටුව විසින් සලකා බලනු ඇත. කමිටුව විසින් නිර්දේශ කිරීම් සිදුකරනු ලබන අතර නිවැරදි කිරීම් සඳහා වන විධානයන් ද අධීක්ෂණය කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 4කදී විගණන කමිටු රැස් විය.

4. කාර්යමණ්ඩලය

අභ්‍යන්තර විගණන ඒකකය පහත සඳහන් කාර්යමණ්ඩලයෙන් සමන්විත වේ.

- ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
- සහකාර අභ්‍යන්තර විගණක
- විගණක සහායක 05
- ව්‍යාපෘති සහකාර 01
- කාර්‍ය සහායක 01

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශ
2024

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		2024	2023 (නැවත දක්වන ලද)	2023
		(රු.)	(රු.)	(රු.)
වත්කම්				
ජංගම වත්කම්				
බැංකුවේ මුදල්	1	9,286,058	4,275,427	4,275,427
කාර්යමණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	2	270,010	270,010	1,143,672
සිසුන්ගෙන් ලැබිය යුතු	3	667,410	209,682	1,327,867
කෙටි කාලීන ආයෝජන	4	94,345,626	101,831,800	101,851,956
භාණ්ඩ තොග		502,171	568,653	464,112
පූර්ව ගෙවීම් සහ ලැබිය යුතු	5	69,924	79,553	79,553
ඉවත් කිරීම සඳහා ඇති ජංගම නොවන වත්කම්		10,800		
ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලිය		39,926	76,383	76,175
		105,191,925 =========	**107,311,508** =========	**109,218,762** =========
ජංගම නොවන වත්කම්				
කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	2	601,652	873,662	
සිසුන්ගෙන් ලැබිය යුතු	3	1,111,503	1,118,185	
දේපළ පිරියත සහ උපකරණ	6	64,423,341	73,617,137	73,473,771
අස්පෘශ වත්කම්	7	236,000	354,000	354,000
කාර්ය මණ්ඩල රකෂණාවරණ තැන්පතු		500,000	500,000	500,000
ලැබිය යුතු තැන්පතු		95,674	95,694	
පරිත්‍යාග වශයෙන් ලද අරමුදල්		650,000	650,000	650,000
		67,618,190	**77,208,678**	**74,977,771**
මුළු වත්කම්		**172,810,116** =========	**184,520,186** ==========	**184,196,533** ==========
කොටස් හා වගවීම්				
ජංගම වගකීම්				
උපචිත වියදම්	8	2,878,404	2,792,331	2,792,331

සුළු ණයහිමියන්	**9**	810,669	195,713	121,810
කලින් ලද ශිෂ්‍ය ගාස්තු	**10**	12,518,866	6,632,032	6,632,032
කලින් ලද උපාධි ප්‍රධානෝත්සව ගාස්තු		78,000		
ඉදි කිරීම් මත රඳවා තබා ගැනීම්		158,859	158,859	158,859
කලින් ලද පොලිය			832,118	832,118
බැංකුව සතු මුදල්				
		16,444,798 =========	**10,611,053** =========	**10,537,150** =========
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන	**11**	6,034,845	6,039,182	7,967,631
මුළු වගකීම්		**22,479,643**	**16,650,235**	**18,504,781**
දළ වත්කම්		**150,330,473** =========	**167,869,952** =========	**165,691,753** =========
දළ වත්කම්/මුදල් සමානයන්				
සමුච්චිත අරමුදල				
ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් කළ	**12**			59,045,158
සමුච්චිත අරමුදල - පුනරාවර්තන		80,859,360	88,771,802	86,465,267
සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන	13	49,468,192	58,769,802	
තක්සේරු සංචිතය		14,716,266	14,716,266	14,716,266
මුළු සමුච්චිත අරමුදල		**145,043,819**	**162,257,257**	**160,226,691**
සංචිත සහ සීමා කළ අරමුදල්				
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සංවර්ධන අරමුදල		4,179,194	4,547,616	4,547,616
පරිත්‍යාග අරමුදල		845,684	797,633	650,000
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන රක්ෂණ අරමුදල		261,776	267,446	267,446
මුළු සංචිත සහ සීමා කළ අරමුදල්		**5,286,654**	**5,612,695**	**5,465,061**
මුළු දළ වත්කම්/කොටස්		**150,330,473** =========	**167,869,952** =========	**165,691,753** =========

පිටු අංක 5 සිට 7 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 8 සිට 16 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යන්ත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සම්පාදනය කිරීමෙහි සහ ඉදිරිපත් කිරීමෙහි ලා කළමනාකරණ මණ්ඩලය වග කියනු ලබයි. එම මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර, මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබා ඇත.

ආචාර්ය ඒ.ආර්.රසූල් අධ්‍යක්ෂ	ආචාර්ය ආර්.එල්.ඒ.එස්. රාජපක්ෂ කළමනාකරණ කමිටු සාමාජික	ආචාර්ය එස්.ඒ.ඒ.කේ. සතරසිංහ කළමනාකරණ කමිටු සාමාජික	ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	ජී.එච්. ගාමිණී සහකාර ලේඛකාධිකාරී

*ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් කර ඇත

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2024 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන	2024 (රු.)	2023 (නැවත දක්වන ලද) (රු.)	2023 (රු.)
ආදායම				
ජංගම				
විනිමය නොවන ගණුදෙනු වලින් ලද ආදායම් - ජංගම				
රජයේ පුනරාවර්තන ප්‍රදාන		5,820,000	3,750,000	3,750,000
විවිධ ලැබීම්		635,792	141,228	141,228
විනිමය නොවන ගණුදෙනු වලින් ලද ආදායම් - ජංගම		**6,455,792**	**3,891,228**	**3,891,228**
විනිමය ගණුදෙනු වලින් ලද ආදායම් - ජංගම				
අයදුම්පත් ගාස්තු		518,000	397,000	397,000
ලියාපදිංචි ගාස්තු		585,100	464,900	464,900
පංති ගාස්තු		10,525,226	13,595,455	13,595,455
විභාග ගාස්තු		1,693,465	844,315	844,315
පරිපූරක ගාස්තු		324,800	314,200	314,200
නිබන්ධන ගාස්තු		1,959,500	1,526,800	1,526,800
කළඹ ගාස්තු		42,500		
ප්‍රායෝගික ඉගැන්වීම් ගාස්තු		1,320,014		
කෙටි පාඨමාලා ගාස්තු		2,569,848	983,336	983,336
පොලී ආදායම	**14**	9,806,141	17,899,096	17,909,042
පිටපත්, සහතිකපත් ගාස්තු		107,300		
ජාත්‍යාන්තර සමුළුව		763,420		
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය				8,735,280
විනිමය ගණුදෙනු මගින් ලද ආදායම - ජංගම		**30,215,314**	**36,025,102**	**44,770,328**
මුළු ආදායම - පුනරාවර්තන		**36,671,106**	**39,916,330**	**48,661,556**
ප්‍රාග්ධන				
විනිමය නොවන ගණුදෙනු වලින් ලද ආදායම - ප්‍රාග්ධන				
පුනරුත්තාපන පුනරාවර්තන සඳහා රජයේ ප්‍රධාන				
දේශීය සහ විදේශීය ත්‍යාග, පරිත්‍යාග				
මුළු ආදායම - ප්‍රාග්ධන				
මුළු ආදායම		**36,671,106**	**39,916,330**	**48,661,556**

<u>**වියදම්**</u>				
ජංගම				
පෞද්ගලික පඩිනඩි	**15**	34,256,958	36,011,727	36,011,727
ගමන් වියදම්	**16**	149,477	173,988	173,988
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	**17**	609,493	753,288	753,288
නඩත්තු වියදම්	**18**	1,200,489	583,886	583,886
කොන්ත්‍රාත් සේවා	**19**	1,033,292	956,610	956,610
වෙනත් පුනරාවර්තන වියදම්	**20**	5,658,632	7,095,241	7,085,241
පාරිතෝෂිත වියදම්		1,529,519	668,746	2,597,195
මානව ප්‍රාග්ධන වියදම්				
නැවත තක්සේරුකිරීමේ හිඟය				
මුළු වියදම් (පුනරාවර්තන නොවන ස්වභාවයේ)		<u>**44,437,859**</u>	<u>**46,243,486**</u>	<u>**48,161,935**</u>
ප්‍රාග්ධන				
ක්ෂයවීම්		9,280,633	8,967,152	8,967,152
අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය		118,000	118,000	118,000
මුළු වියදම් (ප්‍රාග්ධන ස්වභාවයේ)		**9,398,633**	**9,085,152**	**9,085,152**
මුළු වියදම්		**53,836,492**	**55,328,638**	**57,247,087**
වසර සඳහා අතිරික්තය/(හිඟය)		**(17,165,386)** =======	**(15,412,308)** =======	**(8,585,530)** =======
වසර සඳහා අතිරික්තය/(හිඟය) - ජංගම		(7,766,753)	(6,327,156)	(8,585,530)
වසර සඳහා අතිරික්තය/(හිඟය) - ප්‍රාග්ධන		(9,398,633)	(9,085,152)	
		(17,165,386)	**(15,412,308)**	**(8,585,530)**

<u>පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය</u>

<u>2024 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය</u>

	2024	2023
	(රු.)	(රු.)
<u>මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u>		
සාමාන්‍ය කටයුතුවලින් ලද අතිරික්තය/(හිඟය)	(17,165,386)	(8,585,530)
මුදල් නොවන සංචලන ගැලපුම්		
කෙටි කාලීන ආයෝජනවලින් ලද පොලී ආදායම	(9,798,336)	(17,909,042)
ක්ෂයවීම්	9,280,633	8,967,152
පාරිතෝෂිත වියදම්	1,529,519	2,597,195
ප්‍රාග්ධන ප්‍රදාන ගැලපුම් ක්‍රමක්ෂය	-	(9,085,152)
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	118,000	118,000
වත්කම් බැහැර කිරීම මත පාඩුව		21,195
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සංවර්ධන ගැලපුම්	(368,421)	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/හිඟය	**(16,403,991)**	**(23,876,182)**
<u>කාරක ප්‍රාග්ධන වෙනස්වීම්</u>		
භාණ්ඩ ලේඛනවල (ඉහළ යාම) /පහළ යාම	(38,059)	(6,442)
පූර්ව ගෙවීම් සහ ලැබිය යුතු ආදායම්වල (ඉහළ යාම) /පහළ යාම	(404,960)	(1,213,543)
ශිෂ්‍ය ගාස්තු ලැබිය යුතු පොලී ආදායම්වල ඉහළ යාම/ (පහළ යාම)	5,132,716	(443,117)
කාර්ය මණ්ඩලය වෙත ණය සහ අත්තිකාරම්හි (ඉහළයාම)/පහළ යාම	272,010	540,521
ණය කරුවන් සහ උපචිත වියදම්හි (ඉහළයාම)/පහළ යාම	701,029	823,553
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලින් පසු මෙහෙයුම් අතිරික්තය/හිඟය	5,662,737	(299,028)
පාරිතෝෂිත ගෙවීම්	(1,533,856)	(1,928,449)
මෙහෙයුම් කටයුතුවලින් දල මූල්‍ය ප්‍රවාහ	(12,275,110)	(26,103,659)
<u>ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u>		
දේපල, උපාංග සහ උපකරණ මිලදී ගැනීම	(97,637)	(46,000)
පොත් සහ කාලීන සඟරා මිලදී ගැනීම	-	
ආයෝජනවලින් ලද පොලිය	10,737,745	20,112,614
විශේෂ කාර්යන් සඳහා ලද අරමුදල්	-	-
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන රක්ෂණ අරමුදල	(151,000)	-
කෙටි කාලීන ආයෝජන ඉවත්කර ගැනීම්	11,688,403	6,979,844
නව කෙටි කාලීන ආයෝජන	(4,891,770)	-
ආයෝජන කටයුතුවලින් ලද දල මුදල් ප්‍රවාහ	**17,282,741**	**27,046,458**

<u>මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u>		
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		
වැය නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන		
මූල්‍ය කටයුතුවලින් ලද දල මුදල් ප්‍රවාහ		
කාල සීමාව ආරම්භයේ මුදල් සහ මුදල් සමානයන්හි දල ඉහළ යාම/ (පහළ යාම)		
වසර	**5,010,631**	**942,799**
වසර මුලදී මුදල් සහ මුදල් සමානයන්	4,275,427	3,332,628
වසර අගදී මුදල් සහ මුදල් සමානයන්	<u>9,286,058</u>	<u>4,275,427</u>
මුදල් සහ මුදල් සමානයන්හි දළ ඉහළයාම/(පහළයාම)	**5,010,631**	**942,799**

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2024 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දළ වත්කම්/කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

(රු.)

	සමුච්චිත අරමුදල - පුනරාවර්තන	නැවත තක්සේරු කිරීමේ අතිරික්තය	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සංවර්ධන අරමුදල	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ රක්ෂණ අරමුදල	ප්‍රදාන අරමුදල	වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන	එකතුව
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**94,600,847**	**14,716,266**	**4,547,615**		**650,000**	**67,780,438**	**-**	**182,295,166**
පෙර වසරේ ගැලපුම්	199,577				147,633		73,903	421,113
ශිෂ්‍ය පොත් තොග	104,541							104,541
ගිණුම් ක්ෂය ගැලපුම්	144,126							144,126
වසර තුළ ලද අරමුදල්				358,823				358,823
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය						(8,735,280)	8,735,280	-
ඇගිලි සලකුණු යන්ත්‍ර පාඩුව ඉවත් කිරීම	(45,827)							(45,827)
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)	(6,327,156)						(9,085,152)	(15,412,308)
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම						(59,045,158)	59,045,158	-
අරමුදල් පිටතට ගලායාම්	95,694			(91,377)				4,317
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**88,771,802**	14,716,266	**4,547,615**	**267,446**	**797,633**		**58,769,189**	**167,869,952**
පෙර වසරේ ගැලපුම්								-
ප්‍රාග්ධන වත්කම් මිළදී ගැනීම	(97,637)						97,637	-
වසර තුල ලද අරමුදල්				145,330				145,330
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය								-
නැවත තක්සේරු කිරීමේ ලාභ/පාඩු								-
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)	(7,766,753)						(9,398,633)	(17,165,386)
අරමුදල් පිටතට ගලායාම්	(48,051)		(368,421)	(151,000)	**48,051**			(519,421)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**80,859,360**	**14,716,266**	**4,179,194**	**261,776**	**845,684**		**49,468,192**	**150,330,473**

<u>2024 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ - පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ව්‍යවස්ථාපිත වාර්තාව</u>

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යවස්ථාපිත වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ

1	සාමාන්‍ය
1.1	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (1) සහ 107 (ආ) වගන්ති සහ ඉන් පසුව සිදු කරන ලද සංශෝධන සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කර ඇත.
1.2	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශ, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම (GAAP) සහ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කර ඇති බවට සඳහන් කර ඇත්තේ නම් මිස ඒ හැර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.
2	**මූල්‍ය සුවිශේෂතා**
2.1	**රජයේ අරමුදල්**
2.1.1	**ලැබුණු පුනරාවර්තන ප්‍රදාන**

විස්තරය	**2024** **රු.**	**2023** **රු.**
පුනරාවර්තන	5,820,000	3,750,000
ප්‍රාග්ධන	0	0
එකතුව		
	5,823,000	3,750,000

2.2 **මෙහෙයුම් අතිරික්තය/(හිඟය)**

2023 වර්ෂයේදී රුපියල් 15,412,308 ක් වූ ශුද්ධ හිඟයට සාපේක්ෂව 2024 වර්ෂය සඳහා ශුද්ධ හිඟය රුපියල් 17,165,386 කි. මූල්‍ය නොවන ගනුදෙනු ගැලපීමෙන් පසු ආයතනයේ ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ:

විස්තරය	**2024** **රු.**	**2023** **රු.**
ශුද්ධ අතිරික්තය/(හිඟය)	(17,165,386)	(15,412,308)
මූල්‍ය නොවන ගණුදෙනු		
එකතුකලා - අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය සඳහා දීමනාව	9,398,633	9,085,152
පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන	1,529,519	668,746
අඩුකලා - රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග වලින් ලැබුණු වත්කම් ක්‍රමක්ෂය කිරීම		0
නාමික වියදම් සඳහා ගැලපීමෙන් පසු ශුද්ධ මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	**(6,237,234)**	**(5,658,619)**

2.3 සේවකයින්ට ලබා දී ඇති ණය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සේවකයින්ට විවිධ ණය වර්ග හතරක් (ආපදා, පරිගණක, කාර්ය මණ්ඩල සහ වාහන) ලබා දෙන අතර ඒවා වසර හයක කාලයක් තුළ අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභා චක්‍රලේඛ අංක 70 අනුව මාස 12ක් තුළ අයකර ගත යුතු ණය ශේෂයන් සඳහා පොලිය සහ මාස 10ක් තුළ වසරක් තුළ අයකර ගත යුතු ණයෙහි ප්‍රාග්ධනය ජංගම වත්කම් ලෙස දක්වා ඇති අතර ඉතිරිය ජංගම නොවන වත්කම් ලෙස දක්වා ඇත.

විශ්වවිද්‍යාල සේවකයින්ට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ලබා දෙන ණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පරිපාලනය කරනු ලබන බැවින්, එය ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවේ.

2.4 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ භාවිත මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙස අර්ථ දක්වා ඇති අතර වටිනාකම වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වේ.

2024 දෙසැම්බර් 31 වන විට සාරාංශගත බැංකු ගිණුම් ශේෂ පහත පරිදි වේ.

ගිණුම් වර්ගය	2024 රු.	2023 රු.
ඉතිරිකිරීමේ ගිණුම්		
- 174200-226-838310 - 174200-136-838310	8,1794,027 13,828	3,687,879 13,373
ජංගම ගිණුම්		
- 174200-156-838310 - 174200-246-838310 - 174200-336-838310	878,303 100,000 99,900	379,424 94,750 100,000
එකතුව	9,286,058	4,275,427

3 භාණ්ඩ තොග

2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ තොගවල භෞතික සත්‍යාපනය ආයතනය විසින් පත් කරන ලද ස්වාධීන සත්‍යාපන මණ්ඩල මගින් සිදු කරන ලද අතර, සත්‍යාපිත ශේෂයන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

4 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ක්ෂය වීම (PPE)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන් (SLPSAS) 07 හි විධිවිධානවලට අනුකූලව දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා ක්ෂයවීම් කර ඇත. චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති අනුපාතවලට අනුව නැවත තක්සේරු කරන ලද මුදල් සඳහා ක්ෂයවීම් ලබා දෙනු ලැබේ.

5 **පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන අනුව ආයතනයේ සේවකයින්ගේ පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සේවක කාණ්ඩ අනුව 2024 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනවල සාරාංශය පහත පරිදි වේ.

සේවක කාණ්ඩය	**2024** රු.	**2023** රු.
අධ්‍යන	1,612,447	2,410,668
අනධ්‍යන	4,422,398	3,628,514
එකතුව	**6,034,845**	**6,039,182**

6 **අවිනිශ්චිත වත්කම් සහ අවිනිශ්චිත වගකීම්**

ආයතනය විසින් ගොනු කරන ලද සහ ආයතනයට එරෙහිව ගොනු කරන ලද නඩු වලින් පැන නගින අවිනිශ්චිත වත්කම් සහ අවිනිශ්චිත වගකීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිත (SLPSAS) 08 හි දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශනවල උපලේඛනයන්හි අනාවරණය කර ඇත.

7 **එක් සිසුවෙකු සඳහා පිරිවැය**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එක් සිසුවෙකු සඳහා වූ පිරිවැය සහ පසුගිය වසර 5 සඳහා වූ සංසන්දනය පහත දැක්වේ.

වර්ෂය	සිසුන් සංඛ්‍යාව	ශිෂ්‍යයෙකු සඳහා වන පිරිවැය ක්ෂයවීම් සහිතව	ශිෂ්‍යයෙකු සඳහා වන පිරිවැය ක්ෂයවීම් රහිතව රු.	ශිෂ්‍යයෙකු සඳහා වන පුනරාවර්තන ප්‍රදාන රු.
2024	420	128,156	105,778	13,857
2023	417	132,659	110,872	8,993
2022	494	116,959	98,686	61,1612
2021	543	95,912	79,299	60,129
2020	571	84,827	69,249	50,963

8 **පූර්ව කාලසීමාව තුළ දෝෂ**

2023 වසරට අදාළ පෙර කාලසීමාව තුළ දෝෂ 2024 වසරේදී හඳුනාගෙන ඇති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන් (SLPSAS) 03 ට අනුකූලව ඉදිරිපත් කරන ලද පෙර කාලපරිච්ඡේදය සඳහා වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම්/හිමිකම් ආරම්භක ශේෂයන්හි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සඳහන් කිරීමෙන් නිවැරදි කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ - පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණයන්

ආයතනික මූල්‍ය තොරතුරු

1.1.1 ආයතනික තොරතුරු

1.1.2 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ නුගේගොඩ, නාවල පිහිටා ඇති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ ඒ සඳහා පසුව කරන ලද සංශෝධන යටතේ ස්ථාපිත කරන ලද පූර්ණ වශයෙන් රජය සතු උසස් අධ්‍යාපන ආයතනයකි.

1.1.3 නිකුත් කිරීම සඳහා අවසර දෙන ලද දිනය

2025 පෙබරවාරි 27 වන දින පැවති 159 වන රැස්වීමේදී සහ 2025 මැයි 23 වන දින පැවති 161 වන රැස්වීමේදී ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

1.1.4 වාර්තා කිරීමේ කාලය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍යකරණ කාල සීමාව 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා වේ.

1.1.5 මූල්‍ය ප්‍රකාශ

මූල්‍ය ප්‍රකාශවලට 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ හිමිකම් වල වෙනස්කම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය සහ සත්‍ය මුදල සංසන්දනය කිරීම සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් ඇතුළත් වේ.

1.2 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

1.2.1 අනුගතවීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සාධාරණ ඉදිරිපත් කිරීමක් සහතික කිරීම සඳහා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති විට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS) යොදා ගෙන ඇත.

1.2.2 මිනුම් පදනම

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශ, සාධාරණ වටිනාකම මත මනිනු ලබන දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ (PPE) හැර ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

1.2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

ආයතනයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

1.2.4 වාස්තවිකත්වය සහ සමුච්චය

මූල්‍ය ප්‍රකාශනවල සමාන අයිතමවල සෑම අයිතම ප්‍රභේදයක්ම වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයක් හෝ ක්‍රියාකාරිත්වයක් ඇති අයිතම, ඒවා නොසැලකිය යුතු නම්, වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශන බොහෝ ගනුදෙනු හෝ වෙනත් සිදුවීම් ස්වභාවය හෝ ක්‍රියාකාරිත්වය අනුව වර්ගීකරණයන්ට එකතු වන වෙනත් දෑ මගින් මූල්‍ය ප්‍රකාශ සෑදේ.

1.2.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) මගින් අවශ්‍ය නම් හෝ අවසර දී නොමැති නම් මිස, වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් හිලව් කර නොමැත.

1.2.6 අඛණ්ඩතාව

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මණ්ඩලය විසින් අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇති අතර, ඉදිරි කාලය සඳහා ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් සම්පත් ආයතනය සතුව ඇති බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින්, ඈවර කිරීමේ හෝ මෙහෙයුම් නැවැත්වීමේ අවශ්‍යතාවයක් මණ්ඩලය විසින් පුරෝකථනය නොකෙරේ. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආයතනය අඛණ්ඩ පැවැත්මේ පදනම අනුගමනය කරයි.

1.2.7 සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කිරීමේදී, ප්‍රායෝගික නොවන අවස්ථාවන්හිදී, සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කර ඇති අතර, සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කිරීම ප්‍රායෝගික නොවන විට, අගයන් නැවත වර්ගීකරණය කර ඇත්නම් සිදු කරනු ලබන ගැලපීම්වල ස්වභාවය ආයතනය විසින් හෙළිදරව් කර ඇත.

1.2.8 ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය

ආයතනය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) ප්‍රකාරව ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මගින් වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි.

1.3 භාවිත කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අදාල කරගැනීම

2024 වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ආයතනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත SLPSAS අනුගමනය කර ඇත.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - SLPSAS වෙළුම (iii) හි SLPSAS 11 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (බදු සහ මාරු කිරීම්) ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රම 2024.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි යොදාගෙන ඇති අතර 2023.01.01 දින සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ද පෙන්වා දී ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනත් සැලකිය යුතු වෙනස්කම් කිසිවක් සිදුවී නොමැත.

1.3.3 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකාරිත්වය විසින් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු අතර, එමඟින් මූල්‍ය වර්ෂය අවසානයේ ආදායම, වියදම්, වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සහ අවිනිශ්චිත වගකීම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපෑම් ඇති විය හැකිය.

1.3.4 ආදායම් හඳුනාගැනීම

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන සහ විවිධ ව්‍යාපෘති මගින් ලද ආදායම සහ අනෙකුත් ප්‍රදාන, ස්වයං-මූල්‍යකරණ ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලුම ආදායම්, ඒවා ලැබුණු විට සහ සුදුසු වන පරිදි සහ ප්‍රායෝගිකව හඳුනාගෙන ඇත. උපචිත පදනම මත ආදායම් හඳුනාගෙන ඇත.

2024.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් - SLPSAS 11 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (බදු සහ මාරු කිරීම්) ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රම අනුගමනය කිරීම මත පදනම්ව, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය මගින් ප්‍රාග්ධන ප්‍රදාන වලින් ලැබෙන ආදායම ද හඳුනාගෙන ඇත.

1.3.5 රජයේ ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 01 හි විධිවිධානවලට අනුකූලව, ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන හඳුනාගනු ලබන්නේ ආයතනය වෙත ඒවා ලැබුණු විට පමණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - SLPSAS 11 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (බදු සහ මාරු කිරීම්) ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිපත්තින් 2024.01.01 දින සිට යොදා ගැනීමත් සමග දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධන ප්‍රදානවලින් සහ පරිත්‍යාග කරන ලද වත්කම් ආදියෙන් මිලදී ගන්නා විට, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විනිමය නොවන ගනුදෙනුවෙන් ලැබෙන ආදායම - ප්‍රාග්ධනය යටතේ දක්වා ඇත. වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදානය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විනිමය නොවන ගනුදෙනු - ප්‍රාග්ධන ආදායම ලෙස හඳුනාගෙන ඇත. තවද, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන සහ වියදම් නොකළ ගිණුම් හරහා ගිණුම්ගත කර ඇති අතර එහි බලපෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සෘජුවම ඇතුළත් කර ඇත.

1.3.6 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ (PPE)

1.3.6.1 හඳුනාගැනීමේ පදනම

වත්කම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් PPE හඳුනා ගැනේ.

1.3.6.2 මිනුම් පදනම

වත්කමක් ලෙස පිළිගැනීමට සුදුසු **දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ** (PPE) අයිතමයක් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයෙනි. පිරිවැයට වත්කම අත්පත් කර ගැනීම සහ පසුව සිදුවන වියදම් සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත් වේ. ආයතනය විසින් ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක්, අයිතම ගැලවීමේ සහ ඉවත් කිරීමේ පිරිවැය සහ ඒවා පිහිටා ඇති ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය ඇතුළත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

පිරිවැය අනුව මූලික හඳුනාගැනීමෙන් පසු ආයතනය **දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ** (PPE) හි සෑම වර්ගයක් සඳහා පිරිවැය ආකෘතිය අදාළ කරයි. නැවත ඇගයීමක ප්‍රතිඵලයක් ලෙස වත්කම් වර්ගයක ධාරණ ප්‍රමාණය වැඩි වුවහොත්, වැඩිවීම සෘජුවම නැවත ඇගයීමේ අතිරික්තයට බැර කර ඇති අතර, නැවත ඇගයීමක ප්‍රතිඵලයක් ලෙස වත්කම් වර්ගයක ධාරණ ප්‍රමාණය අඩු වුවහොත්, එය අතිරික්තයක් හෝ හිඟයක් ලෙස හඳුනාගෙන ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 07 හි විධිවිධානවලට අනුකූලව දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ උපකරණ සඳහා ක්ෂයවීම් සඳහා වන දීමනාව ලබා දී ඇත. සියලුම **දේපළ,**

පිරියත සහ යන්ත්‍රෝපකරණ (PPE) කාණ්ඩ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇත්නම්, ඊළඟ වසර ආරම්භයේදී නැවත තක්සේරු කර ඇත. වක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතවලට අනුව නැවත තක්සේරු කරන ලද මුදල් මත ක්ෂය ලබාදේ. අදාල නැවත තක්සේරු කිරීමේ වසරින් පසුව මිලදී ගන්නා ලද/ඉදි කරන ලද සියලුම PPE කාණ්ඩ පිරිවැයට දක්වනු ලබන අතර එකී වක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතයන් අනුව ක්ෂයවීම් ලබා දේ.

1.3.6.3 වත්කම් ඉවත් කිරීම

අයිතමයක් බැහැර කිරීමේදී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට එකී අයිතමය ඉවත් කරනු ලැබේ. වත්කම් ඉවත් කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් වත්කම ඉවත් කරන වර්ශයේ අතිරික්තයක් හෝ හිඟයක් ලෙස හඳුනා ගැනේ.

1.3.6.4 දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන කාර්යන්

දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන කාර්යන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැය අනුව දක්වා ඇති අතර ආයතනය විසින් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක වීමට හැකි වීමට අවශ්‍ය ස්ථානයේ සහ තත්ත්වයක් ඇති විට අදාළ වත්කමට මාරු කරනු ලැබේ.

1.3.6.5 ක්ෂය වීම

ආයතනය විසින් ඉඩම හැර ක්ෂය කිරීමේදී සරල රේඛීය ක්ෂය කිරීමේ ක්‍රමය අනුගමනය කරයි, එහිදී පහත සඳහන් අනුපාතවලට ක්ෂය කරනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා වක්‍රලේඛ: 649 මත පදනම්ව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ක්ෂයවීම් වියදම් හඳුනාගෙන ඇත.

- ගොඩනැගිලි 5%
- පිරියත හා උපකරණ 20%
- පරිගණක සහ උපාංග 20%
- ලී බඩු සහ උපාංග 10%
- කාර්යාල සහ වෙනත් උපකරණ 20%
- විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ 20%
- පුස්තකාල පොත් සහ කාලීන සඟරා 20%
- උපාධි ලෝගු 20%

වත්කමක ක්ෂයවීම ආරම්භ වන්නේ එය භාවිතයට ලබා ගත හැකි දින සිට හෝ ආයතනය විසින් ඉදිකරන ලද වත්කම් සම්බන්ධයෙන් වත්කම සම්පූර්ණ කර භාවිතයට සූදානම් දින සිටය. වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කරන ලද දිනට පෙර හෝ වත්කම ඉවත් කරන දිනයේදී ක්ෂයවීම නතර වේ.

1.3.6.6 ආයතනයේ ඉඩම් සහ ගොඩනැගිලි

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩම්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට නීත්‍යානුකූලව පවරා නොමැති අතර, ආයතනය විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මූල්‍ය ප්‍රකාශ තුළ ඉඩම්වල අයිතිය හඳුනා ගැනීමට සහ හෙළිදරව් කිරීමට ආයතනයේ නියමාවලියේ නීතිමය විධිවිධාන නොමැත.

පර්වස් පහළොවක ඉඩම 2016 දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු. 22,500,000.00 කට තක්සේරු කර ඇති අතර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත.

1.4 අස්පෘශ්‍ය වත්කම්

1.4.1 හඳුනාගැනීමේ පදනම

ආයතනය විසින් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ, එම වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් ය.

1.4.2 මිනුම් පදනම

වෙන් වෙන්ව අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අනුව මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම්, ක්‍රමක්ෂය සහ හානි කිරීමේ පාඩු ඇත්නම්, ඒවා අඩු කර පිරිවැය යටතේ පවත්වාගෙන යනු ලැබේ.

1.4.3 පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය අදාළ නිශ්චිත වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දරන ලද වියදම් ලෙස හඳුනා ගැනේ.

1.4.4 ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය, ක්ෂය වීම සහ දුර්වලතා

සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලයන්හි පිරිවැය ලියා තැබීම සඳහා සරල රේඛා ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය කරනු ලබන අතර එය සාමාන්‍යයෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනා ගැනේ. සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, වාර්ෂිකව සහ අස්පෘශ්‍ය වත්කම් දුර්වල වීමට ඉඩ ඇති බවට ඇඟවීමක් ඇති විට, හානිය සඳහා තක්සේරු කරනු ලැබේ.

සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වසර 05ක් පුරා ක්‍රමක්ෂය කෙරේ. ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ අවශේෂ අගයන් වාර්තා කරන සෑම දිනකම සමාලෝචනය කර සුදුසු නම් ගැලපීම් කරනු ලැබේ.

1.4.5 භාණ්ඩ තොග

2024 දෙසැම්බර් 31 වන දිනට ආයතනයේ භාණ්ඩ තොග භෞතිකව සත්‍යාපනය කර, ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) පදනම මත පිරිවැයට අනුව තක්සේරු කර ඇත.

1.4.6 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 01 ප්‍රකාරව, වාර්තාකරණ දින සිට මාස දොළහක් ඇතුළත වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ ඇස්තමේන්තුගත මුදලින් සඳහන් වේ. බොල් ණය හා අවිනිශ්චිත ණය සඳහා වෙන් කිරීමක් කර නොමැත.

1.4.7 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැති මුදල් සහ ජංගම, ඉතුරුම් සහ කෙටි කාලීන තැන්පතු ගිණුම්වල ඉතිරිව ඇති ශේෂයන් ය. තවද, මුදල් සහ මුදල් හා සමාන දෑ පිළිබඳ විස්තර ගිණුම් ප්‍රකාශනයේ සටහන් අංක I හි අනාවරණය කර ඇත.

1.4.8 ආයෝජන

ආයතනය, බැංකු ගිණුම්වල බැර කර ඇති තාවකාලික අතිරික්ත අරමුදල්, භාණ්ඩාගාර බිල්පත් සහ රාජ්‍ය බැංකුවල කාලීන තැන්පතු වන ආයෝජනය කර ඇත. ඒ සඳහා ලද පොලිය මූල්‍ය කාලපරිච්ඡේදය අවසානයේ ඉදිරියට රැගෙන යන වටිනාකමට ගලපා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශවල "පුනරාවර්තන/හුවමාරුව" ආදායම ලෙස දක්වා ඇත. ආයෝජන සහ ආයෝජන මත ලැබෙන පොලී ආදායම පිළිබඳ වැඩිදුර විස්තර සටහන් 04 සහ 14 හි අනාවරණය කර ඇත.

1.4.9 වියදම් හඳුනා ගැනීම

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර ඍජු සම්බන්ධතාවයක පදනම මත ය. ආයතනය පවත්වාගෙන යාමේදී සහ දේපළ

කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ආරෝපණය කර ඇත.

1.4.10 පර්යේෂණ ප්‍රදාන

පර්යේෂණ ප්‍රදානවල ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා ආයතනය වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යයි. තනි ලෙජර් ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන සඳහා වියදම් ලෙස දක්වා ඇති අතර පර්යේෂණ ප්‍රදාන ලාභ නොලබන පදනමක් මත ක්‍රියාත්මක වන බැවින් වියදමට සමාන මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන සඳහා ආදායම ලෙස දක්වා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - SLPSAS 11 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (බදු සහ මාරු කිරීම්) ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රම, 2024.01.01 දින සිට යොදා ගැනීමත් සමග, දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ පර්යේෂණ ප්‍රදානවලින් මිලදී ගන්නා විට, ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන (විනිමය නොවන) ආදායම යටතේ පෙන්වනු ලැබේ. 2024 දෙසැම්බර් 31 වන දිනට මෙම තනි පර්යේෂණ ප්‍රදානවල බැර කිරීමට ඇති ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

1.4.11 විලම්භිත ආදායම

පශ්චාත් උපාධි පාඨමාලා, කෙටි පාඨමාලා, අර්ධකාලීන පාඨමාලා ආදිය හරහා ජනනය වන ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා ආයතනය වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යයි. තනි ලෙජර් ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් ඍජු වියදම් ලෙස වර්ගීකරණය කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇත. 2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - SLPSAS 11 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (බදු සහ මාරු කිරීම්) ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රම, යොදා ගැනීමත් සමග, දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ පර්යේෂණ ප්‍රදානවලින් මිලදී ගන්නා විට, ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන (විනිමය නොවන) ආදායම යටතේ පෙන්වනු ලැබේ. මෙම ක්‍රියාකාරකම් ගිණුම්වල බැර කිරීමට නියමිත ශේෂයන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශවල සංචිත සහ වත්මන් වගකීම් යටතේ දක්වා ඇත.

1.4.12 වෙනත් අරමුදල්

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වයට අයත් නොවන විවිධ ක්‍රියාකාරකම් හරහා ආයතනය අරමුදල් උත්පාදනය කරන අතර මෙම ක්‍රියාකාරකම්වල ගිණුම්කරණ ගනුදෙනු සඳහා වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. තනි ලෙජර් ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අනෙකුත් ව්‍යාපෘති සඳහා වියදම් ලෙස දක්වා ඇති අතර, වියදමට සමාන මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අනෙකුත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම ලෙස දක්වා ඇත. 2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - SLPSAS 11 විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (බදු සහ මාරු කිරීම්) ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රම, යොදා ගැනීමත් සමග, දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ පර්යේෂණ ප්‍රදානවලින් මිලදී ගන්නා විට, ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන (විනිමය නොවන) ආදායම යටතේ පෙන්වනු ලැබේ. මෙම ගිණුම්වල ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වනු ලැබේ.

1.4.13 පරිත්‍යාග අරමුදල (Endowment Fund)

භාවිතයට නොගත් පරිත්‍යාග ලෙස අරමුදල් ලැබෙන විට, එවැනි ආයෝජනවලින් උපයන ආදායම පමණක් හඳුනාගෙන ආදායම ලෙස භාවිතා කළ හැකිය. අදාළ ගිවිසුම හෝ ව්‍යවස්ථාව වෙනත් ආකාරයකින් විධිවිධාන සලසා නොමැති නම් මිස, ඉහත එක් එක් කාණ්ඩය යටතේ ඇති අරමුදල්වලින් ලැබෙන ආයෝජන ආදායම සහ අනෙකුත් ලාභ සුදුසු අරමුදල්වලට වෙන් කරනු ලැබේ. අරමුදල්වල අරමුණු වන්නේ එක් එක් නිශ්චිත විභාගයේ හොඳම ප්‍රතිඵල සඳහා පදක්කම් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමයි.

1.4.15 බදු

1.4.15.1 ආදායම් බද්ද

පවතින බදු රෙගුලාසි වලට අනුව, සාමාන්‍ය ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම මත ආයතනය ආදායම් බදු ගෙවීමට බැඳී නොමැත.

1.4.15.2 එකතු කළ අගය මත බද්ද

පවතින බදු රෙගුලාසි වලට අනුව ආයතනය එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කර ඇත.

1.4.15.3 උපයන විට ගෙවීමේ බදු (PAYE Tax) / අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT)

ආයතනය විසින් ආදායම් බදු ගෙවීමට බැඳී සිටින සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කර උපයන විට ගෙවීමේ බදු PAYE/APIT බද්ද ප්‍රේෂණය කරයි. එබැවින්, උපයන විට බදු ගෙවීම ආයතනයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකෙරේ.

1.4.16 සේවක ප්‍රතිලාභ

1.4.16.1 අර්ථ දැක්වීම්

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

අදාළ සේවාව සපයන විට කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වියදම් වේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස මෙම මුදල ගෙවීමට ආයතනයට වර්තමාන නෛතික හෝ ඵලදායී බැඳීමක් තිබේ නම් සහ වගකීම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි නම්, ගෙවීමට අපේක්ෂිත මුදල සඳහා වගකීමක් හඳුනා ගැනේ.

අර්ථ දක්වන ලද දායක සැලැස්ම

ආයතනයේ ස්ථිර සේවකයින් අදාළ ප්‍රඥප්තිවලට අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් (UPF) දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් (ETF) දායකත්වය සඳහා සුදුසුකම් ලබන අතර තාවකාලික/කොන්ත්‍රාත්/පැවරුම් පදනම මත බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) සඳහා හිමිකම් ලබයි. අදාළ සේවාව සපයන බැවින්, නිශ්චිත දායක මුදල් සැලසුම් සඳහා දායක මුදල් සඳහා වන බැඳීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව, සේවකයින්ට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමක් සඳහා වගකීමක් පැන නගී. එවැනි අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමක් 'සේවක ප්‍රතිලාභ' පිළිබඳ SLPSAS-19 හි විෂය පථයට අයත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීමකි.

1.4.17 ප්‍රතිපාදන සහ විධිවිධාන

1.4.17.1 විධිවිධාන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට වර්තමාන වගකීමක් ඇති විට විධිවිධාන හඳුනාගනු ලබන අතර, බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වීමට ඉඩ ඇති අතර බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිය. උපචිත වියදම් යටතේ ප්‍රතිපාදන දක්වා ඇත. බොහෝ දුරට ඉඩ ඇති ප්‍රතිඵලය ඇගයීමක පදනම මත ආයතනය ඇස්තමේන්තුවකට එළඹේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම ප්‍රතිපාදන ගිණුම්ගත කර ඇත.

1.4.17.2 අවිනිශ්චිත වත්කම්

2024 දෙසැම්බර් 31 වන දිනට ආයතනය විසින් ආරම්භ කරන ලද නීතිමය නඩු නොමැති බැවින් 2024 දෙසැම්බර් 31 වන දිනට අවිනිශ්චිත වත්කම් නොමැත.

1.4.17.3 අවිනිශ්චිත වගකීම්

2024 දෙසැම්බර් 31 වන දිනට ආයතනයට එරෙහිව කිසිදු නීතිමය නඩුවක් පවරා නොමැති බැවින්, මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.

1.4.18 අයවැය ඉදිරිපත් කිරීම

ආයතනයේ අයවැය සකස් කරනු ලබන්නේ ගිණුම්කරණයේ උපචිත පදනම මත ය. අයවැයේ අනුගමනය කරන ලද වර්ගීකරණ පදනම වන්නේ වියදම්වල ස්වභාවය වන අතර එය ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමයම වේ. භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව ආයතනය විසින් ආදායම් සහ වියදම් වර්ගීකරණය සිදු කරනු ලැබේ. අයවැය සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනමක් මත සකස් කර ඇති බැවින්, අයවැය සහ සත්‍ය මුදල් සංසන්දනය කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී. අයවැය 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කාලය ආවරණය කරයි.

අයවැය සහ සත්‍ය මුදල් ප්‍රමාණයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය සටහන අංක 21 හි දක්වා ඇත.

1.4.19 වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

සටහන - 01

බැංකු මුදල්	2024 (රු.)	2023 සංශෝදිත (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
මහජන බැංකු ගිණුම් අංක 174100 156 838310	878,303	379,424	379,424
මහජන බැංකු ගිණුම් අංක 174100 246 838310	100,000	94,750	94,750
මහජන බැංකු ගිණුම් අංක 174100 336 838310	99,900	100,000	100,000
මහජන බැංකු ගිණුම් අංක 174200 226 838310	8,194,027	3,687,879	3,687,879
මහජන බැංකු ගිණුම් අංක 174200 136 838310	13,828	13,373	13,373
සුළු මුදල්			
	9,286,058	**4,275,427**	**4,275,427**

සටහන - 02

කාර්යමණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ආපදා ණය	841,662	1,091,672	1,091,672
රථවාහන ණය	30,000	52,000	52,000
විවිධ අත්තිකාරම්			
	871,662	**1,143,672**	**1,684,193**

සටහන - 03

ශිෂ්‍යයින්ගෙන් ලැබීමට නියමිත ආදායම්	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ලැබීමට නියමිත ලියාපදිංචි ගාස්තු TESL	26,000.00		
ලැබීමට නියමිත ලියාපදිංචි ගාස්තු TESL පැරණි	23,200.00	60,300	60,300
ලැබීමට නියමිත ලියාපදිංචි ගාස්තු TLSC	12,000.00		
ලැබීමට නියමිත ලියාපදිංචි ගාස්තු BE	1,600.00		
ලැබීමට නියමිත ලියාපදිංචි ගාස්තු PPE		4000	4,000
ලැබීමට නියමිත පරිපූරක ගාස්තු TESL පැරණි	16,800.00	40,800	40,800
ලැබීමට නියමිත පරිපූරක ගාස්තු TLSC	7,800.00		
ලැබීමට නියමිත පරිපූරක ගාස්තු TESL නව	21,800.00	100	100
ලැබීමට නියමිත පරිපූරක ගාස්තු PPE		2,000	2,000
ලැබීමට නියමිත පරිපූරක ගාස්තු BE	1,500.00		
ලැබීමට නියමිත පංති ගාස්තු - TESLපැරණි	443,000.00	563,000	563,000
ලැබීමට නියමිත පංති ගාස්තු - TESL නව	602,130.00	234,715	234,715
ලැබීමට නියමිත පංති ගාස්තු - TLSC පැරණි			

ලැබීමට නියමිත පංති ගාස්තු - TLSC			
ලැබීමට නියමිත පංති ගාස්තු - BE	43,400.00	83,700	83,700
ලැබීමට නියමිත පංති ගාස්තු - PPE	49,000.00		
ලැබීමට නියමිත පංති ගාස්තු - PPE		39,700	39,700
ලැබීමට නියමිත නිබන්ධන ගාස්තු TESL නව	40,000	40,000	40,000
ලැබීමට නියමිත නිබන්ධන ගාස්තු TESL පැරණි	79,500.00	166,500	166,500
ලැබීමට නියමිත නිබන්ධන ගාස්තු TESC	283,500.00		
ලැබීමට නියමිත විභාග ගාස්තු PPE	35,800.00	35,800	35,800
ලැබීමට නියමිත විභාග ගාස්තු TLSC	5,040.00		
ලැබීමට නියමිත විභාග ගාස්තු TESL පැරණි	13,500.00	18,750	18,750
ලැබීමට නියමිත විභාග ගාස්තු TESL	21,170.00		
ලැබීමට නියමිත විභාග ගාස්තු BE	4,340.00	8,370	8,370
ලැබීමට නියමිත කළඹ ගාස්තු TESL පැරණි	18,500.00		
ප්‍රායෝගික ඉගැන්වීම් - TESL	14,000.00		
ප්‍රායෝගික ඉගැන්වීම් - BE	3,333.00	9,999	9,999
	1,778,913	**1,220,667**	**1,220,667**
	========	========	========

සටහන - 04

<u>කෙටි කාලීන ආයෝජන</u>	<u>2024 (රු.)</u>	<u>2023 (සංශෝදිත) (රු.)</u>	<u>2023 (විගණනය කරන ලද)</u>
ආරම්භක ශේෂය	101,407,472	108,831,800	108,831,800
වසර තුළ ආපසු ගැනීම් - ස්ථාවර තැන්පතු	-		
වසර තුළ ආපසු ගැනීම් - භාණ්ඩාගාර බිල්පත්	(12,000,000)	(6,979,844)	(6,979,844)
නව ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්	4,938,154		
	94,345,626	**101,851,956**	**101,851,956**
	=========	=========	=========

සටහන - 05

<u>පූර්ව ගෙවීම් සහ ලැබිය යුතු</u>	<u>2024 (රු.)</u>	<u>2023 (සංශෝදිත) (රු.)</u>	<u>2023 (විගණනය කරන ලද) (රු.)</u>
ලැබිය යුතු පොලිය			
පූර්ව ගෙවීම්	69,924	79,553	79,553
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත ලැබිය යුතු			
	69,924	**79,553**	**1,293,096**
	======	======	======

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

සටහන - 06

ජංගම නොවන වත්කම්

	ලී බඩු සහ උපාංග	කාර්යාල උපකරණ	පරිගණක සහ උපාංග	පුස්තකාල පොත් සහ කාලීන සඟරා	පිරියත හා උපකරණ	වෙනත් වත්කම්	ගොඩනැගිල්ල	ඉඩම	මුළු එකතුව
<u>පිරිවැය</u>									
2024-01-01 දිනට **ශේෂය**	4,271,714	2,599,721	8,520,294	2,596,481	7,090,768	68,850	93,593,508	-	118,741,336
(+/-) ගැලපුම්									
(+) වසර තුල මිලදී ගැනීම්	83,997	13,640							97,637
(-) නැවත තක්සේරු කිරීමට මාරු කිරීම									-
(-) වසර තුල බැහැර කිරීම්			(18,000)						(18,000)
									-
2024-12-31 දිනට **ශේෂය**	**4,355,711**	**2,613,361**	**8,502,294**	**2,596,481**	**7,090,768** ========	**68,850** ======	**93,593,508** ========	-	**118,820,973**
<u>ක්ෂයවීම්</u>			8,502,294						
2024-01-01 දිනට **ශේෂය**	1,851,702	1,022,745	3,394,118	2,046,899	2,325,219	27,086	34,456,430	-	45,124,199
(+/-) ගැලපුම්						13,770	4,649,675		9,280,633
(+) වසර සඳහා ක්ෂය කිරීම්	429,283	519,996	1,700,459	519,296	1,418,154				-
(-) නැවත තක්සේරු කිරීමට මාරු කිරීම									(7,200)
(-) වසර තුල බැහැර කිරීම්			(7,200)						
2024-12-31 දිනට **ශේෂය**	2,280,985	1,542,741	5,087,377	2,566,195	3,743,373	40,856 =====	39,136,105 ========		54,397,632
2024-01-01 දිනට පොත්වල සටහන් කරන ලද දල අගය	2,420,012	1,576,976	5,126,176	549,582	4,765,549	41,764	59,137,078		73,617,137
2024-12-31 දිනට **පොත්වල සටහන් කරන ලද දල අගය**	**2,074,726**	**1,070,620**	**3,414,917**	**30,286**	**3,347,395**	**27,994**	**54,457,403**		**64,423,341**

සටහන - 07

අස්පෘශ්‍ය වත්කම්	2024 (රු.)	2023 සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
පරිගණක මෘදුකාංග	354,000	472000	472000
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(118,000)	(118,000)	(118,000)
	236,000	**354,000**	**354,000**
	======	======	======

සටහන - 08

උපචිත වියදම්	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
2023 වර්ෂය සඳහා විගණන ගාස්තු	594,720	620,000	
2024 වර්ෂය සඳහා විගණන ගාස්තු	600,000		620,000
විදුලි සංදේශ වියදම්	16,200	17,753	17,753
අතිකාල	62,413	25,795	25,795
පැමිණීමේ දීමනා	8,000		
බාහිර කථිකාචාර්ය ගාස්තු TESL නව	90,000	204,000	204,000
බාහිර කථිකාචාර්ය ගාස්තු BE	144,000		
පිරියත සහ යන්ත්‍රෝපකරණ නඩත්තුව	22,420		
මුද්දර ගාස්තු සහ උපයන විට ගෙවීම් බදු	1,000	4,225	4,225
වැටුප් ගෙවියයුතු - අධ්‍යක්ෂ		612,504	612,504
වෙනත් ගෙවිය යුතු	33,000	3,850	3,850
ආරක්ෂක සේවා	154,694		
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු	30,000	36,000	36,000
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු BE	48,000		
පිරිසිදු කිරීමේ සේවා	106,268	38,073	38,073
විභාග ගාස්තු - TESL නව	92,100	65,100	65,100
විභාග ගාස්තු - TESL පැරණි	197,000		
විභාග ගාස්තු - BE	42,300		
තාක්ෂණික සහාය දීමනාව	23,800		
අනධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් කොන්ත්‍රාත්	307,443	303,658	303,658
තාවකාලික සේවක අර්ථසාධක අරමුදල (EPF)		61,858	61,858
අනධ්‍යයන කාර්යමණ්ඩල කොන්ත්‍රාත් ETF	4,681	9,279	
අධ්‍යන කාර්යමණ්ඩල කොන්ත්‍රාත් ETF	2,670		9,279
අනධ්‍යයන කාර්යමණ්ඩල කොන්ත්‍රාත් EPF	31,210		
අධ්‍යයන කාර්යමණ්ඩල කොන්ත්‍රාත් EPF	17,800		
තක්සේරුකරණ කමිටු ගෙවීම්		15,000	15,000
ගුවන් ප්‍රවේශපත්‍ර		306,224	306,224

PPE වියදම්	94,400	27,501	27,501
BE වියදම්		63,000	63,000
නව MA TESL වියදම්		10,000	10,000
කාර්යමණ්ඩල සංවර්ධනය		16,500	16,500
පාඨමාලා වලට අදාල අත්පොත්		24,000	24,000
අධ්‍යන කාර්‍ය මණ්ඩල වැටුප්	128,383	189,412	189,412
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල		26,600	26,600
විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල		12,000	12,000
තොරතුරු පද්ධති කළමනාකරණ උපදේශන		100,000	100,000
PGIE රක්ෂණ අරමුදල	25,899		
	2,878,404	**2,792,331**	**2,792,331**
	=======	=======	=======

සටහන - 09

<u>සුළු ණය හිමියන්</u>	<u>2024 (රු.)</u>	<u>2023 (සංශෝදිත) (රු.)</u>	<u>2023 (විගණනය කරන ලද)</u> (රු.)
විවෘත විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු	466,767	47,839	47,839
ලංකා සෙකියුරිටි (පෞද්ගලික) සමාගම		5,337	5,337
ICLL කලින් ලද	150,000		
ක්‍රාෆ්ට් ලංකා ඉංජිනියර්ස් (පෞද්ගලික) සමාගම		42,730	42,730
ඊවිස්		25,904	25,904
අබාන්ස්		73,903	
කලින් ලද කෙටි පාඨමාලා ගාස්තු	120,000		
සමන් ඇඩ්වර්ටයිසින්			
DS Books (Pvt) Ltd	73,903		
	810,669	**195,713**	**121,810**
	======	======	======

සටහන - 10

<u>කලින් ලද ශිෂ්‍ය ගාස්තු</u>	<u>2024 (රු.)</u>	<u>2023 (සංශෝදිත) (රු.)</u>	<u>2023 (විගණනය කරන ලද)</u> (රු.)
කලින් ලද පංති ගාස්තු TLSC		850	850
කලින් ලද පංති ගාස්තු TESL නව	6,418,642.00	2,572,285	2,572,285
කලින් ලද පංති ගාස්තු TLSC			
කලින් ලද පංති ගාස්තු BE	3,890,224.00	1,116,000	1,116,000
කලින් ලද පංති ගාස්තු PPE		1,196,917	1,196,917
කලින් ලද නිබන්ධන ගාස්තු TLSC		1,500	1,500
කලින් ලද ගුරු අභ්‍යාස ගාස්තු TESL		972,000	972,000
කලින් ලද ගුරු අභ්‍යාස ගාස්තු BE	1,718,600.00	266,680	266,680

කලින් ලද විභාග ගාස්තු TESL නව		394,200	394,200
කලින් ලද විභාග ගාස්තු BE	491,400.00	111,600	111,600
කලින් ලද අයදුම්පත් ගාස්තු BE			
	12,518,866	**6,632,032**	**6,632,032**
	=======	========	========

සටහන - 11

පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන	2024 (රු.)	2023 (නැවත දක්වන ලද) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ආරම්භක ශේෂය	6,039,181	7,298,884	7,298,884
වසර තුල පාරිතෝෂිත ගෙවීම්	(1,533,855)	(1,926,449)	(1,926,449)
වසර සඳහා ප්‍රතිපාදන	1,529,519	668,746	2,597,195
අවසන් ශේෂය	**6,034,845**	**6,039,181**	**7,967,630**
	=======	=======	=======

සටහන - 12

වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන	2024 (රු.)	2023 (නැවත දක්වන ලද) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ආරම්භක ශේෂය	-	67,780,438	67,780,438
මෙම වසර සඳහා ක්‍රමක්ෂය	-	(8,735,280)	(8,735,280)
සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන සඳහා මාරු කිරීම		(59,045,158)	
	-		**59,045,158**
	========	========	========

සටහන - 13

සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන	2024 (රු.)	2023 (නැවත දක්වන ලද) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ආරම්භක ශේෂය	59,045,158	-	-
වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන මගින් මාරු කිරීම		59,045,158	-
ප්‍රාග්ධන වියදම්			**-**
	59,045,158	**59,045,158**	**-**
	========	========	========

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

සටහන - 14

පොලී ආදායම	2024 (රු.)	2023 (නැවත දක්වන ලද) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ඉතුරුම් ගිණුම්වලින් ලද පොලිය	94,010	31,695	31,695
ප්‍රදාන වලින් ලද පොලිය	58,051	75,524	75,524
භාණ්ඩාගාර බිල්පත් වලින් ලද පොලිය	9,611,366	17,745,273	17,745,273
කාර්යමණ්ඩලය වෙත ලබා දෙන ලද ණය සහ අත්තිකාරම්හි පොලිය	42,714	56,550	56,550
	9,806,141	**17,909,042**	**17,909,042**
	=======	=======	=======

සටහන - 15

පෞද්ගලික පඩි නඩි	2023 (රු.)	2022 (නැවත දක්වන ලද) (රු.)	2022 (විගණනය කරන ලද) (රු.)
අධ්‍යයන			
වැටුප් සහ වේතන - අධ්‍යන			
වැටුප් සහ වේතන	5,324,020.14	8,018,133	8,018,133
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	1,166,473	1,490,654	1,490,654
විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප්	939,295	958,160	958,160
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3%	404,897	456,927	456,927
බාහිර කථිකාචාර්ය ගාස්තු	1,782,000	1,756,125	1,756,125
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු	429,000	297,125	297,125
	10,045,685	**12,977,124**	**12,977,124**
	=======	=======	=======
වෙනත් දීමනා			
අධ්‍යයන දීමනාව	7,453,992	7,112,161	7,112,161
පර්යේෂණ දීමනාව	1,321,310	1,595,332	1,595,332
ජීවන වියදම් දීමනාව	626,768	336,155	336,155
මාසික දීමනාව	192,097	215,484	215,484
අතිරේක දීමනා	785,744	912,570	912,570
සංග්‍රහ දීමනාව	188,424	185,184	185,184
දුරකථන දීමනාව	51,000,00	51,000	51,000
වෙනත් දීමනා	1,202,185	1,213,495	1,213,495
	11,821,520	**11,621,381**	**11,621,381**
	=======	=======	=======
පෞද්ගලික පඩි නඩි - අධ්‍යයන	**21,867,205**	**24,598,505**	**24,598,505**

අනධ්‍යයන	2024 (රු.)	2023 (සංශෝධිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
වැටුප් හා වේතන			
වැටුප් හා වේතන	6,448,887	6,086,592	6,086,592
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	895,956	790,851	790,851
විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප්	353,415	332,027	332,027
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3%	232,092	210,132	210,132
වැඩබැලීම වෙනුවෙන් ගෙවීම්			
	7,930,350	**7,419,602**	**7,419,602**
වෙනත් දීමනා			
පර්යේෂණ දීමනාව	323,668	317,672	317,672
ජීවන වියදම් දීමනාව	1,191,600	592,783	592,783
මාසික දීමනාව	360,000	379,667	379,667
අතිරේක දීමනාව	657,458	683,658	683,658
දුරකථන දීමනාව	40,000	48,000	48,000
අතුරු දීමනාව			
MCA	1,479,280	1,540,373	1,540,373
ගැලපුම් දීමනාව			
	4,052,005	**3,562,154**	**3,562,154**
පෞද්ගලික වැටුප් සහ දීමනා - අනධ්‍යයන	**11,982,355**	**10,981,765**	**10,981,765**
අතිකාල දීමනා සහ නිවාඩු සඳහා ගෙවීම්			
අතිකාල දීමනා	84,442	167,960	167,960
තාක්ෂණික සහාය	271,075	227,763	227,763
නිවාඩු සඳහා ගෙවීම්	51,881	35,744	35,744
	407,398	**431,466**	**431,466**
මුළු පෞද්ගලික වැටුප් සහ දීමනා	**34,256,958**	**36,011,727**	**36,011,727**

සටහන - 16

ගමන් වියදම්	2024 (රු.)	2023 (සංශෝධිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
දේශීය	149,477	173,988	173,988
විදේශීය			
	149,477	**173,988**	**173,988**

සටහන - 17

සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	187,607	159,988	159,988
ඉන්ධන සහ ලිහිසි තෙල්	254,886	370,820	370,820
කාර්මික සහ විද්‍යුත් භාණ්ඩ			
නිල ඇඳුම්			
වෙනත් සැපයුම්	167,000	222,480	222,480
	609,493	**753,288**	**753,288**
	======	======	======

සටහන - 18

නඩත්තු වියදම්	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	1,150,209	536,069	536,069
ගොඩනැගිලි සහ සැකසුම්	50,280	47,817	47,817
වෙනත් නඩත්තු වියදම්			
	1,200,489	**583,886**	**583,886**
	======	======	======

සටහන - 19

කොන්ත්‍රාත් සේවා	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
පිරිසිදු කිරීමේ සේවා	244,655	382,962	382,962
ආරක්ෂක සේවා	205,101	126,000	126,000
තැපැල් ගාස්තු	38,200	39,840	39,840
විදුලි සංදේශ	195,810	211,111	211,111
විදුලිය	16,444	13,401	13,401
ජලය	10,206	12,443	12,443
මුද්‍රණ ප්‍රචාරණය	305,945	170,854	170,854
ප්‍රවාහනය	**16,932**		
වෙනත්			
	1,033,292	**956,610**	**956,610**
	======	======	======

සටහන - 20

වෙනත් පුනරාවර්තන වියදම්	2024 (රු.)	2023 (සංශෝදිත) (රු.)	2023 (විගණනය කරන ලද) (රු.)
විශ්වවිද්‍යාලය වෙත සංචාරක ප්‍රදාන			
මුද්දර ගාස්තු	4,250	8,650	8,650
විශේෂ සේවා - පීය සභාව සහ කමිටු	980,077	1,102,589	1,102,589
විශේෂ සේවා - වෘත්තිකයින්	600,000	620,000	620,000
වැඩමුළු, සම්මන්ත්‍රණ	70,249	234,981	234,981
කාර්යමණ්ඩල රක්ෂණය		234,981	234,981
කාර්යමණ්ඩල සංවර්ධනය			
සිසුන් සඳහා පාඨමාලා අමුද්‍රව්‍ය			
ආයතන සැලසුම්, පාලනය	22,490	92,620	92,620
නිවාඩු ගමන් බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර	60,502	94,300	94,300
සංග්‍රහ වියදම්	62,791	58,155	58,155
බැංකු ගාස්තු	28,475	1,000	1,000
දායකත්ව මුදල් සහ සාමාජික ගාස්තු	3,500	7,000	7,000
විභාග ගාස්තු	328,471	331,211	331,211
වත්කම් බැහැර කිරීම්		21,195	21,195
කෙටි පාඨමාලා වියදම්	1,410.249	545,787	545,787
සේවක සුබසාධනය			
දේපල ණය පොලී	44,100	64,546	64,546
වෙනත්	257,296	624,285	624,285
තාවකාලික EPF/ETF			
ප්‍රදාන වියදම් කිරීම්	10,000	10,000	10,000
ශිෂ්‍යයින් සඳහා පාඨමාලා ලිපිද්‍රව්‍ය			
PPPE වියදම්	108,855	849,829	849,829
BE වියදම්	244,529	1,137,274	1,137,274
නව TESL වියදම්	659,379	1,234,115	1,234,115
ජාත්‍යන්තර සමුළු සඳහා වියදම්	763,420		
	5,658,632	**7,095,241**	**7,095,241**
	=======	=======	=======

සටහන - 21

අයවැය විචලනයන් - වියදම්	අයවැය 2024	සත්‍ය 2024	වෙනස්වීම්
පුද්ගල පඩිනඩි			
වැටුප් හා වේතන	13,539,272	11,772,907	1,766,365
UPF දායකත්වයන්	2,546,182	2,062,429	483,753

විශ්‍රාම වැටුප් - 8%	1,336,364	1,292,710	43,654
ETF දායකත්වය - 3%	670,909	636,989	33,920
අධ්‍යාන දීමනාව	8,258,182	7,453,992	804,190
ජීවන වියදම් දීමනාව	1,882,909	1,818,368	64,541
පර්යේෂණ දීමනාව	1,768,364	1,644,978	123,386
20% අමතර මාසික දීමනාව	1,510,909	1,443,202	67,707
45% මාසික වන්දි දීමනාව	1,550,182	1,479,280	70,902
මාසික දීමනාවන් (රු.5000/-)	558,545	552,097	6,448
අතිකාල	52,363	84,442	(32,079)
නිවාඩු දින ගෙවීම්	21,818	51,881	(30,063)
සන්නිවේදන දීමනාව	96,000	91,000	5,000
ප්‍රවාහන දීමනාව	645,545	1,202,185	(547,640)
ඉන්ධන දීමනාව	663,272		663,273
අනෙකුත් දීමනා - කරුණාකර සඳහන් කරන්න.	-		-
වැඩ බැලීමේ දීමනාව	-		-
සමපාත දීමනාව	-		-
සංග්‍රහ දීමනාව	207,273	188,424	18,849
තාක්ෂණික සහාය දීමනාව	256,364	271,073	(14,711)
	-		-
භාහිර කථිකාචාර්ය දීමනාව	2,000,000	2,211,000	(211,000)
පාරිතෝෂිත ගෙවීම්	1,673,455	1,533,855	139,600
එකතුව	**39,246,909**	**35,790,813**	**3,456,096**

ගමන් වියදම්			
දේශීය	200,000	149,477	50,523
විදේශීය			
එකතුව	**200,000**	**149,477**	**50,523**

සැපයුම්			
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	150,000	187,607	(37,607)
ඉන්ධන සහ ලිහිසි තෙල්	281,455	254,886	26,569
නිල ඇඳුම්	-		-
යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	-		-
රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ	-		-
වෛද්‍ය සැපයුම්	-		-
වෙනත්	200,000	167,000	33,000
එකතුව	**631,455**	**609,493**	**21,962**

නඩත්තු වියදම්

වාහන	-		-
පිරියත සහ යන්ත්‍රෝපකරණ	1,208,727	1,150,209	58,518
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	100,000	50,280	49,720
ගෘහ භාණ්ඩ	-		-
වෙනත්	-		-
එකතුව	**<u>1,308,727</u>**	**<u>1,200,489</u>**	**<u>108,238</u>**
කොන්ත්‍රාත් සේවා			
ප්‍රවාහනය		16,932	(16,932)
විදුලි සංදේශ	195,000	195,810	(810)
තැපැල් ගාස්තු	75,000	38,200	36,800
විදුලිය	240,000	16,444	223,556
ජලය	120,000	10,206	229,794
වරිපනම් සහ දේශීය බදු	-		120,000
බදු කුලී ගාස්තු	-		-
ආරක්ෂක සේවා	300,000	205,101	(205,101)
පිරිසිදු කිරීමේ සේවා	250,000	244,655	55,345
මුද්‍රණය, ප්‍රචාරණය ආදිය (අලෙවිකරණ සැලැස්ම, වෙබ් අඩවිය, වීඩියෝ)	400,000	305,945	(55,945)
වෙනත්		-	400,000
එකතුව	**<u>1,580,000</u>**	**<u>1,033,292</u>**	**<u>546,708</u>**
අනෙකුත් පුනරාවර්තන වියදම්			
විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ගමන් වියදම් ප්‍රදාන			
විශේෂ සේවා - පීය සභාව සහ කමිටු	1,000,000	980,077	(980,077)
- එම - වෘත්තීය සහ අනෙකුත් ගාස්තු	-	600,000	400,000
වැඩමුළු, සම්මන්ත්‍රණ	76,363	70,249	(70,249)
ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශන	-		76,363
කාර්ය මණ්ඩල සංවර්ධනය (ගුරුවරුන්, පරිපාලකයින් සඳහා පුහුණුව සහ අනෙකුත් සේවකයින්)	-		-
සිසුන් සහ ඉගෙනුම් ගුණාත්මකභාවය සඳහා පාඨමාලා ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම	-		-
කර්මාන්ත සීමාවාසික පුහුණුව, ප්‍රායෝගික සහ වෘත්තීය මාර්ගෝපදේශ	-		-
ශිෂ්‍ය සංවර්ධන ප්‍රවේශයන් සහ ප්‍රජා සබඳතා	-		-
විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	-		-
ශිෂ්‍ය සුබසාධනය, ශිෂ්‍ය සභා සහ සමාජ සමගිය	-	763,420	(763,420)
සේවක සුභසාධනය සහ වෛද්‍ය ආධාර	138,545		-
ආයතනික සැලසුම්කරණය, පාලනය සහ ප්‍රජා සම්බන්ධතා	-	22,490	116,055
දේපල ණය සඳහා පොලී සහනාධාරය	-	44,100	(44,100)
නිවාඩු දින දුම්රිය සහ වාර ප්‍රවේශපත්	-	60,502	(60,502)
උපාධි ප්‍රධානෝත්සව වියදම්	43,636		-

සංග්‍රහ වියදම්	57,818	62,791	(19,155)
බැංකු ගාස්තු	-	28,475	29,343
සම්මාන සහ වන්දි	46,909		-
දායකත්ව සහ සාමාජික ගාස්තු	-	3,500	43,409
විභාග වියදම්	-	328,471	(328,471)
සෘජු වියදම් - ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් (කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2016 හි 5.5.1)	4,364		-
වක්‍ර වියදම් - ස්වයං මූල්‍ය කටයුතු (කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2016 හි 5.5.1)	508,364	249,342	(244,978)
වෙනත්	1,872,000	261,545	246,819
එකතුව	**3,747,999**	**3,474,962**	**(1,602,962)**
ශිෂ්‍යයන් සඳහා මූල්‍ය සහාය			
ශිෂ්‍යාධාර ගෙවීම (විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා අදාල නොවේ)			
මහපොල ගෙවීම් (විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා අදාල නොවේ)			
මුළු වියදම	**46,715,090**	**42,258,525**	**2,580,566**

අයවැය විචලයන් - ආදායම	**අයවැය 2024**	**සත්‍ය 2024**	**වෙනස්වීම්**
අභ්‍යන්තර ආදායම			
සංවර්ධන අරමුදලින් මාරු කිරීම	7,650,000		**(7,650,000)**
වෙනත් ආදායම්			-
ලියාපදිංචි ගාස්තු	20,000	585,100	565,100
උපකාරක පංති ගාස්තු			-
විභාග ගාස්තු		1,693,465	1,693,465
ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම	26,000,000	18,130,608	(7,869,392)
ආයෝජන වලින් පොලී	9,156,000	9,798,336	642,336
ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොලිය			-
දේපල වලින් ලද කුලී අදායම			-
පුස්තකාල දායකත්ව මුදල්	35,000		(35,000)
වෙනත්		635,792	635,792
			-
රජයේ ප්‍රදාන			-
පුනරාවර්තන දීමනා			-
පුද්ගලික පඩිනඩි	5,000,000	5,820,000	820,000
වෙනත් පුනරාවර්තන			
	47,861,000	**36,663,301**	**(11,197,699)**

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/PGIE/2024/01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 30 දින.

Postgraduate Institute of English
02 JUN 2025

අධ්‍යක්ෂ,

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 01. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

මගේ අංකය / எனது இல. / My No.: HED/F/1/PGIE/2024/01 | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2025 මැයි 30 දින

අධ්‍යක්ෂ,

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2005 අංක 04 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලියේ 18 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන

වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව		අනුකූල නොවීම
(අ)	2005 දෙසැම්බර් 13 දිනැති අංක 1436/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය	Doric de Zoysa gold medal අරමුදල හා Research awards අරමුදල පිහිටුවීම සඳහා 2021 වර්ෂයේදී පරිත්‍යාගකරුවෙකුගෙන් ලැබී තිබූ රු.650,000ක මුදල ආයතන නියමාවලියට අනුව විශ්වවිද්‍යාලය විමසා ශිෂ්‍යත්ව ලබාදීමට භාවිතා කර නොතිබුණි.
(ආ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ආයතනයේ පිරිවැය රු.2,596,491ක් වූ පුස්තකාල පොත් හා වාර සඟරා, විවෘත විශ්වවිද්‍යාල පුස්තකාලයේ පවත්වාගෙන යන පරිග්‍රහණ ලේඛනය හා සම්බන්ධතාවයකින් යුතුව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද 2008 වර්ෂයෙන් පසු පුස්තකාල පොත් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදයට අනුව	ගිණුම් වර්ෂයක් අවසන් වී මාස 05ක් ඇතුළත විගණකාධිපති වාර්තාව ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සහිත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2025 මාර්තු 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(ඈ)	1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	විභාගයක් පැවැත්වූ දින සිට මාස 03ක් ඇතුළත එහි ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් 2024 වර්ෂයේදී පාඨමාලා 2ක් යටතේ පවත්වා තිබුණු විභාග 10ක ප්‍රතිඵල නිකුත් කිරීමට දින 13 සිට දින 113ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) වසර 02කට වැඩි කාලයක සිට ශිෂ්‍යයන්ගෙන් අයවිය යුතු රු.1,004,470ක් වූ පාඨමාලා ගාස්තු අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් වෛද්‍ය සුභසාධන රක්ෂණ යෝජනා ක්‍රමය සලසා ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට රු.500,000ක අත්තිකාරම් මුදලක් 2021 පෙබරවාරි 25 දින ගෙවා තිබුණි. එහෙත් 2023 වර්ෂයේ දී ආයතනය එම වෛද්‍ය සුභසාධන රක්ෂණ ක්‍රමයෙන් ඉවත් වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ආරම්භ කර තිබුණු ආයතනය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන පාඨමාලාවන් 05 සඳහාම 2024 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 333ක් වූ අතර එම වර්ෂය තුළදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 110ක් විය. මින් එක් පාඨමාලාවක් සඳහා 2022 වර්ෂයේ සිට එක් ශිෂ්‍යයකු හෝ ලියාපදිංචි වී නොතිබුණු අතර තවත් පාඨමාලාවක් සඳහා 2021 වර්ෂයේදී ශිෂ්‍යයන් දෙදෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණ ද එක් ශිෂ්‍යයකු හෝ එම පාඨමාලාව අවසන් කර නොතිබුණි. දෙවනබස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම- ශාස්ත්‍රපති උපාධිය (TLSC) සඳහා 2019-2022 කාලය තුළ ශිෂ්‍යයන් 47 දෙනෙකු ලියාපදිංචිවී තිබූ අතර 2023 පසුව මෙම පාඨමාලාව සඳහා කිසිදු ශිෂ්‍යයකු ලියාපදිංචි වී නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda

Telephone: 011-2825805, 2825806, 2881027, 2881032, 2853777
Director: Ext. 528, SAR: Ext. 527 AB: Ext. 532

2025.06.12

විගණකාධිපතිතුමා.

ජාතික විගණන කාර්යාලය,

අංක 306/ 72 පොල්දූව පාර

බත්තරමුල්ල.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ඔබ ගේ අංක - HED/F/1/PGIE/2024/01 දරණ 2025 මැයි 30 දිනැති විගණන වාර්ථාව හා බැඳේ. මෙම ආයතනයේ කරුණු දැක්වීමට පහත සඳහන් වේ.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

(අ) විශ්ව විද්‍යාලයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(ආ) මෙම ආයතනය විසින් පිරිවැය රු. 2,569,411.00 පිරිවැය වූ පුස්තකාල පොත් වල අදාළ ස්ථාවර වත්කම් ලේඛනයේ මෘදුකාංග පිටපත් (Excel sheet) සහ අනිකුත් ස්ථාවර වත්කම් මෙන් නඩත්තු කර ඇති ලේඛනයේ පිටපතක් විගණනයට 2025/03/28 ලබා දී ඇත.

(ඇ) 2023 වාර්ෂික වාර්තාවේ ඉංග්‍රීසි පිටපත 2024 පෙබරවාරි මස කළමනාකර මණ්ඩලයේ අනුමැතිය මත විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද අතර 2024 වර්ෂයේ පැවති විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩ වර්ජනය හේතුවෙන් කාර්යාල කටයුතු වල ප්‍රමාදයන් සිදු වූ අතර මෙහි පිටපත දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කරන ලදුව අමාත්‍යාංශ නිරීක්ෂණ 2024.08.09 දින ලැබුනු අතර මෙම ආයතනයේ භාෂා පරිවර්තකයන් නොමැති බැවින් වෙනත් රාජ්‍ය ආයතනයක නිලධාරීන් වෙත සිංහල හා දෙමළ භාෂා පරිවර්තනය කිරීම සඳහා බර දී අදාල පරිවර්තන ලැබුන පසු 2024.10.23 දින විගණකාධිපතිගේ වාර්තාවද සමග භාෂාත්‍රයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025.04.22 දිනැතිව අප වෙත

එවන ලද ලිපිය මගින් 2023 වාර්ෂික වාර්තාවට 2025.03.03 දින කැබිනට් අනුමැතිය ලැබී ඇති බැවින් එය පාර්ලිමේන්තුවට භාරදෙන මෙන් අප වෙත කරන ලද දැනුම් දීම පරිදි හැකි ඉක්මණින් මෙය භාරදීමට කටයුතු කරනු ලැබේ.
තවද ආයතනික මට්ටමේ ප්‍රමාදයන් ඇත්නම් ඒවා හැකිතාක් දුරට වලක්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඈ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීම පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සන්දර්භය මතින් පහත සඳහන් මූලික කරුණු පැහැදිලි කිරීමක් සිදු කිරීම යෝග්‍යා බවට අදහස් කරමි.

මෙම ආයතනයේ සමස්ත ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය දෙදෙනෙකු පමණකි. මෙහි දේශන හා අධ්‍යයන කටයුතු සාම්ප්‍රදායික විශ්ව විද්‍යාල ආදියෙන් වෙනස් වේ. ඒ අනුව විශ්ව විද්‍යාලයක දී නම් උත්තරපත්‍ර ඇගයීමේදී අදාල පාඨමාලාවක පරීක්ෂකවරුන් සියලු දෙනා එක් දෙපාර්තමේන්තුවක හෝ එක් පීඨයක ස්ථිර සේවයේ යෙදෙන ආචාර්යවරුන් විය හැක. එමඟින් උත්තර පත්‍ර ලකුණු කිරීමේ/ ඇගයීමේ ක්‍රියාවලිය ඉක්මනින් කරගත හැකි වේ. මෙම ආයතනයේ විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත්වී ඇති බොහෝ දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාලවල, උසස් අධ්‍යාපන ආයතන වල හා ඒවැනි ආයතන පරිපාලනය කරන ප්‍රධාන ස්ථානවල තනතුරු දරන විද්වතුන් වේ. එබැවින් ඔවුන්ගේ කාල වේලාවන් වෙන් කර ගැනීම ආයතනයට ද ගැටළු සහගත වුවද ඔවුන්ගේ ප්‍රවීණත්වය අනුව අප ශිෂ්‍යයන්ට වඩා හොඳ දැනුම් සම්භාරයක් ලබා දීමටද අප විසින් අනුගමනය කරන ශිෂ්‍යයන්ට තමන්ගේ පිළිතුරු පත්‍ර වලට ලබාදෙන ප්‍රතිපෝෂණය ආදී කරුණු මතද ඔවුන්ගේ දායකත්වය ඉමහත් වේ. එබැවින් ඉහත දක්වන කරුණු මත හා වෙනත් යම් යම් බාහිර සාධක මත ඇතැම් විෂයයන් වල පමණක් ප්‍රතිඵල නිකුත් වීමේ ප්‍රමාදයක් සිදු විය හැක.
නමුත් විගණන වාර්තාවේ සඳහන් කර ඇති ඇතැම් විභාග ප්‍රතිඵල ප්‍රමාදයක් සහිතව නිකුත් කිරීම අදාළ පාඨමාලාවේ අවසන් විභාග ප්‍රතිඵල නිකුත් කිරීම කෙරෙහි බලපෑමක් ඇතිකර නොමැති අතර හැකි ඉක්මණින් විභාග ප්‍රතිඵල නිකුත් කිරීම කෙරෙහි නිරන්තර උත්සාහයන් කරමින් පවතී.

2.3 වෙනත් කරුණු

(අ) ශිෂ්‍යයන් නැවත ලියාපදිංචිය සෑම වසරකම සිදු වන අතර ඔවුන්ගේ නැවත ලියාපදිංචියේ දී සියලු හිඟ මුදල් ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. තවද ආයතනය විසින් ශිෂ්‍යයන් හට නිරන්තරයෙන් සිහි කැඳවීම් කරනු ලැබේ.

(ආ) මෙම ගෙවීමට අදාලව වාර්තාවක් මෙම ආයතනයට ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කර නැති බැවින් නිසි පරිදි නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

(ඇ) ඉහත නිරීක්ෂණයේ සඳහන් වන ශිෂ්‍ය සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට එනම් 2024 දෙසැම්බර් 31 වන දිනට 422 ලෙස නිවැරදි විය යුතුවේ. එම ශිෂ්‍ය සංඛ්‍යාව පහත පරිදි දැක්විය හැකි අතර එය අපගේ 2024 වාර්ෂික වාර්තාවේ ද දක්වා ඇත.

වර්ෂය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති උපාධිය (TESL)	දෙවන බස පසු බිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති උපාධිය (TLSC)	ද්වි භාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - (BE)	ඉංග්‍රීසි භාෂාව වෘත්තීය මය ලෙස හැසිරවීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PPE)	දර්ශනශූරී	කෙටි කාලීන පාඨමාලා	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව
2024/25 2024/12/31 දිනට	228	47	56	0	2	89	**422**

තවද සමාලෝචිත වර්ෂය සඳහා පැවැත්වුණු උපාධි ප්‍රධානෝත්සව දෙකකදී ශිෂ්‍යයන් එකසිය විසි පහක් (125) සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ ශාස්ත්‍රපති උපාධි පිරිනමා ඇත. දෙවන බස පසු බිමක් තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පාඨමාලාව නවීකරණය විය යුතු බවට 2022 සිට සාකච්ඡා පැවැති අතර ඒ අනුව පාඨමාලාව පිළිබඳව පසුගිය කාලයේ ලබාගත් අදහස් හා යෝජනා පදනම් කරගෙන එහි විෂය නිර්දේශයන් වෙනස් කිරීමේ කටයුතු අධ්‍යයන මණ්ඩලයේ ද අනුමැතිය සහිතව මේ වන විටත් සිදුවෙමින් පවතින බැවින් නවීකරණය කරන ලද පාඨමාලාව ඉදිරිපත් කිරීම සමගම ශිෂ්‍යයන් බඳවා ගැනීමට තීරණය කර ඇත. ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ද ශිෂ්‍යයන් ලියාපදිංචිය අඩුවක් නිරීක්ෂණය වූ අතර අයදුම් පත් කැඳවීම තරමක් ප්‍රමාද කර සිදුකළ අතර එය සාර්ථක වූ බැවින් එම පාඨමාලාව සඳහා 2024 නොවැම්බර් මාසයේදී අයදුම් පත්‍ර කැඳවා 2025 දී සිසුන් හතළිස් පහක් බඳවා ගන්නා ලදී. දර්ශනපති/ දර්ශනශූරී පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ දෙදෙනා ලියාපදිංචිය අලුත් කර ගනිමින් අධ්‍යාන කටයුතුවල යෙදී සිටී.

සමස්තයක් ලෙස 2025 වර්ෂයේදී ආයතනයේ සියලුම පාඨමාලා සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිපුර බඳවා ගැනීමට සැලසුම් කර ඇති බවද සඳහන් කිරීමට කැමැත්තෙමි.

Dr. Romola Rassool
Director
Postgraduate Institute of English
The Open University of Sri Lanka
Nawala, Nugegoda.

අධ්‍යක්ෂ,
පශ්චාද් උපාදි ඉංග්‍රීසි භාෂා ආයතනය.

පිටපත්

1.	සභාපති	-	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2.	ලේකම්	-	අධ්‍යාපන අමාත්‍යාංශය
3.	ලේකම්	-	මුදල් අමාත්‍යාංශය
4.	විගණන අධිකාරී	-	විවෘත විශ්වවිද්‍යාල ශාඛාව
5.	සහකාර අභ්‍යන්තර විගණක	-	විවෘත විශ්වවිද්‍යාල